සීමාන්විතයි

# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

# 2015 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සීමාන්විතයි

# 2015 වාර්ෂික කාර්ය සාධන වාර්තාව





# ප්‍රස්ථාවනාව



වසර ගණනාවක් මුළුල්ලේ, ප්‍රතිත්‍රස්ත මෙහෙයුම් තුළින් ලබාගන්නා ලද අත්දැකීම්වල පන්නරය හේතුවෙන්, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෘත්තීයමය නිපුණත්වයෙන් සවිමත් හමුදාවක් බවට පත්වී ඇති අතර, උපායමාර්ගික වශයෙන් ලොව අනෙකුත් දියුණු හමුදාවන්ගේ මට්ටමට අවතීර්ණ වී තිබේ. ගෙවී ගිය 2015 වසර තුළදී හමුදා පුහුණුව, ජාතිය ගොඩනැගීමේ ව්‍යාපෘති හා එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන් වැනි විවිධ ක්ෂේත්‍ර වෙත යොමුවූ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, සිය වෘත්තීයමය නිපුණතාව මැනවින් පිළිබිඹු කිරීමට සමත්වී තිබේ.

නිරන්තරයෙන් වෙනස්වන ආරක්ෂක තත්වයන්ට හා අභියෝගවලට සාර්ථක ලෙස මුහුණදීමට හැකිවන පරිදි කැපවීමකින් හා වගකීමකින් යුතුව බුද්ධිමත්ව කටයුතු කිරීම සඳහා රටෙහි මානව ප්‍රාග්ධන වර්ධනයට ප්‍රමුඛතාව ලබාදීම කාලීන අවශ්‍යතාවක් වන අතර, වර්තමානයේ පවතින ක්‍රමෝපායික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සියලුම නිලයන් දැනුමින් හා හැකියාවන්ගෙන් සන්නද්ධ කරවීම ඉතා වැදගත්ය. එබැවින් පශ්චාද් සංග්‍රාමික මෙහෙයුම් සමයේ කාර්යක්ෂම පැවැත්මට මෙන්ම, බාහිර හා අභ්‍යන්තර වශයෙන් ඇති විය හැකි අභියෝග වලට සාර්ථකව මුහුණදීම සඳහා මේ වන විට විශේෂ අවධානයක් යොමුකර තිබෙන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, සිය මානව සම්පතෙහි දැනුම, සංග්‍රාමික හා හට කාර්ය සම්පාදනය කරමින් මෙන්ම තොරතුරු හා සයිබර් මෙහෙයුම් සඳහාද පුහුණුව ලබාදෙමින් සම පුළුල් ජාතික සංවර්ධනයක් සඳහාද පූර්ණ දායකත්වය සපයමින් සිටී.

රටක භෞමික අඛණ්ඩතාවය හා ස්වෛරීත්වය සුරක්ෂිත කිරීමෙහිලා ජාතික ආරක්ෂාව අත්‍යවශ්‍ය සාධකයකි. ඒ අනුව වර්තමානයේ ශීඝ්‍රයෙන් වෙනස්වන ආරක්ෂක තත්වයන්ට මුහුණදීමට හැකිවන පරිදි නව අංශ ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් සිය මානව ප්‍රාග්ධනය මෙහෙයවනු ලබමින් සිටින අතර, ආරක්ෂක තර්ජනවලට සාර්ථකව මුහුණදීමට අවශ්‍ය තත්කාලීන බුද්ධිමය තොරතුරු ලබාගැනීම සඳහා නියමුවන් රහිත ගුවන්යානා ඒකකය පිහිටුවා තිබේ. එතුළින් විශේෂ තාක්ෂණික තොරතුරු ලබාගැනීමේ හැකියාව ඇතුළු තවත් සුවිශේෂී කාර්යයන් රැසක් සිදුකර ගැනීම සඳහා දායකත්වය සපයනු ලබමින් සිටින අතර, අභිනවයෙන් ස්ථාපිත කිරීමට යෝජිත සාම සාධක අණදෙන ඒකකය මගින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් සිදුකරනු ලබන සාම සාධක මෙහෙයුම් සඳහා අවැසි නිපුණත්වය වර්ධනය සිදුකරනු ඇත. තවද, දැනුමෙන් හා හැකියාවන්ගෙන් පිරිපුන් යුද්ධ හමුදාවක් ගොඩනැංවීමට ගනු ලබන උත්සහයේදී අවශ්‍යවන ඉදිරි තාක්ෂණික දැනුම හා හැකියාව ලබාගැනීමේ අරමුණින් අභිනවයෙන් ස්ථාපිත කළ, පර්යේෂණ විශ්ලේෂණ යෝජනා සම්පාදන හා සංවර්ධනය සඳහා වූ ශාඛාව මනා පිටුවහලක් සපයන අතර, අද වන විට වත්මන් අභියෝගවලට මුහුණදීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් වෘත්තීය අධ්‍යාපනයේ නවීන සංකල්ප වන මෘදු බලය (Soft power) හා සයිබර් මෙහෙයුම් (Cyber warfare) වැනි නව ක්ෂේත්‍රද හඳුන්වා දී තිබේ.

ඒ අනුව සලකා බැලීමේදී 2016 වර්ෂය තුළදී සාක්ෂාත් කරගැනීමට අපේක්ෂිත අරමුණු සඳහා මෙම කාර්ය සාධන වාර්තාව පදනම් කරගත හැකි වන බව සඳහන් කළ හැකිය.



**ඒ ඩබ්ලිව් ජේ සි ද සිල්වා ආර්ඩබ්ලිව්පි විඑස්වි යූඑස්පි එන්ඩියු පිඑස්සි**
ලුතිතන් ජෙනරාල්
යුද්ධ හමුදාධිපති

**<u>පටුන</u>**

| | | |
|---|---|---|
| | පටුන | ii |
| | රූප සටහන් නාමාවලිය | iv |
| | ප්‍රස්ථාර නාමාවලිය | v |
| | සංඛ්‍යා සටහන් නාමාවලිය | vi |
| | කෙටියෙදුම් | vii |
| | පෙරවදන | viii |
| | ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආයතන ව්‍යුහය | ix |
| 1. | හැඳින්වීම | 1 |
| 2. | 2015 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම | 4 |
| 3. | අභිනවයෙන් ස්ථාපිත සංස්ථා | 6 |
| 4. | මානුෂීය බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය | 8 |
| 5. | යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සුභසාධනය | 11 |
| 6. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා ව්‍යාපෘති | 12 |
| 7. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා හදිසි ආපදා කළමනාකරණ මෙහෙයුම් | 14 |
| 8. | යුද සේවා ලේකම් ශාඛාව | 15 |
| 9. | ප්‍රධාන මාණ්ඩලික ශාඛාව | 17 |
| 10. | මූල්‍ය කළමනාකරණ ශාඛාව | 27 |
| 11. | විධායක ජෙනරාල් ශාඛාව | 35 |
| 12. | උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව | 39 |
| 13. | යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව | 42 |
| 14. | අධ්‍යක්ෂ ජෙනරාල් පාබල ශාඛාව | 47 |
| 15. | මූලස්ථානය හය කාර්ය සම්පාදන අණසක | 48 |
| 16. | ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලය | 49 |
| 17. | ප්‍රධාන සංඥා නිළධාරි කාර්යාලය | 53 |

18. ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය

19. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය

20. විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලය

21. යුද්ධ හමුදා පුහුණු අංශා මුලස්ථානය

22. සමාලෝචනය

ඇමුණුම

අ. ශ්‍රි ලංකා යුද්ධ හමුදා මුලස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිළධාරි නාමාවලිය

## රූප සටහන් ලැයිස්තුව


| අ/අ | මාතෘකාව | පිටුව |
|---|---|---|
| රූප සටහන 10:1 | ප්‍රධාන මාණ්ඩලික ශාඛාව යටතේ ඇති සංස්ථා | 17 |
| රූප සටහන 11:1 | මූල්‍ය කළමනාකරණ ශාඛාව යටතේ ඇති සංස්ථා | 27 |
| රූප සටහන 12:1 | විධායක ජෙනරාල් ශාඛාව යටතේ ඇති සංස්ථා | 35 |
| රූප සටහන 13:1 | උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ ඇති සංස්ථා | 39 |
| රූප සටහන 14:1 | යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ ඇති සංස්ථා | 42 |
| රූප සටහන 18:7 | ප්‍රධාන සංඥා නිළධාරි කාර්යාලය යටතේ ඇති සංස්ථා | 53 |
| රූප සටහන 22:1 | යුද්ධ හමුදා පුහුණු අණසක යටතේ ඇති සංස්ථා | 60 |

## ප්‍රස්ථාර නාමාවලිය


| අ/අ | | මාතෘකාව | පිටුව |
|---|---|---|---|
| ප්‍රස්ථාරය | 1:1 | ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංයුතිය | 1 |
| ප්‍රස්ථාරය | 1:2 | රෙජිමේන්තු අනුව සංයුතිය | 3 |
| ප්‍රස්ථාරය | 2:1 | අයවැය වෙන් කිරිම සහ වියදම | 5 |
| ප්‍රස්ථාරය | 5:1 | 2015 දෙසැම්බර් 31 වන දිනට මානුෂීය බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය | 9 |
| ප්‍රස්ථාරය | 10:1 | 2015 වසරේ පුහුණු පාඨමාලා සාරාංශය | 22 |
| ප්‍රස්ථාරය | 11:1 | 2015 වසර සඳහා පුනරාවර්ථන හා මුලධන වැය ශිර්ෂ වෙන්කිරිම සහ වියදම | 29 |

## සංඛ්‍යා සටහන් නාමාවලිය


| අ/අ | මාතෘකාව | පිටුව |
|---|---|---|
| සංඛ්‍යා සටහන 1:1 | යුද්ධ හමුදා සංයුතිය | 1 |
| සංඛ්‍යා සටහන 1:2 | රෙජිමේන්තු අනුව යුද්ධ හමුදා සංයුතිය | 2 |
| සංඛ්‍යා සටහන 2:1 | 2015 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම | 4 |
| සංඛ්‍යා සටහන 5:1 | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ අනෙකුත් ආයතන මඟින් බිම් බෝම්බ ඉවත් කරන ලද මුළු භූමි ප්‍රමාණය | 9 |
| සංඛ්‍යා සටහන 5:2 | බිම් බෝම්බ අවධානම පිළිබඳ අධ්‍යාපන වැඩ සටහන් විස්තරය | 10 |
| සංඛ්‍යා සටහන 9:1 | නිළධාරි නිළ උසස් කිරීමේ විස්තරය - 2015 | 15 |
| සංඛ්‍යා සටහන 9:2 | 2014/2015 වර්ෂවල විශ්‍රාමික නිළධාරි විස්තරය | 16 |
| සංඛ්‍යා සටහන 10:1 | එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා අනුයුක්ත කරන ලද නිළධාරි සංඛ්‍යාව | 20 |
| සංඛ්‍යා සටහන 10:2 | 2015 වර්ෂය තුළ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් වෙනුවෙන් ලද ආදායම | 20 |
| සංඛ්‍යා සටහන 10:3 | සිවිල් සේවක සංයුතිය | 24 |
| සංඛ්‍යා සටහන 11:1 | 2015 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙන් කිරීම | 28 |
| සංඛ්‍යා සටහන 11:2 | 2015 වර්ෂය සඳහා මූලධන වියදම් වෙන් කිරීම | 28 |
| සංඛ්‍යා සටහන 11:3 | 2015 වර්ෂය සඳහා අතිරේක පුනරාවර්ථන වියදම් වෙන් කිරීම | 30 |
| සංඛ්‍යා සටහන 11:4 | 2015 වර්ෂය සඳහා අතිරේක මූලධන වියදම් වෙන් කිරීම | 30 |
| සංඛ්‍යා සටහන 11:5 | 2015 වර්ෂය තුළ ගෙවනු ලැබූ ආබාධිත විශ්‍රාමික වැටුප් හා පාරිතෝෂික මුදල් ලබාදුන් ණය විස්තරය | 31 |
| සංඛ්‍යා සටහන 11:6 | යුද්ධ හමුදා යහසාධක අරමුදල් ණය විස්තරය | 31 |
| සංඛ්‍යා සටහන 11:7 | සෙසු නිළයින්ගේ සේවය දීර්ඝ කිරීම | 31 |
| සංඛ්‍යා සටහන 11:8 | යුද්ධ හමුදා වැය ශීර්ෂ | 32 |
| සංඛ්‍යා සටහන 11:9 | වෙනත් වැය ශීර්ෂ | 32 |
| සංඛ්‍යා සටහන 14:1 | යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාවේ මූල්‍ය විස්තරය | 43 |
| සංඛ්‍යා සටහන 17:1 | ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලයේ විස්තරය | 51 |
| සංඛ්‍යා සටහන 19:1 | 2015 වසර තුළ ලද ක්‍රීඩා ජයග්‍රහණ | 57 |

# කෙටි යෙදුම්

| | |
|---|---|
| ආරක්‍ෂක සේනා මුලස්ථානය (යාපනය) | ආසේමු (යා) |
| ආරක්‍ෂක සේනා මුලස්ථානය (වන්නි) | ආසේමු (ව) |
| ආරක්‍ෂක සේනා මුලස්ථානය (නැගෙනහිර) | ආසේමු (නැ) |
| ආරක්‍ෂක සේනා මුලස්ථානය (කිළිනොච්චි) | ආසේමු (කිළි) |
| ආරක්‍ෂක සේනා මුලස්ථානය (මුලතිව්) | ආසේමු (මුල) |
| ආරක්‍ෂක සේනා මුලස්ථානය (බටහිර) | ආසේමු (බ) |
| ආරක්‍ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) | ආසේමු (ම) |
| ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය | ශ්‍රීලසසබ |
| ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව | ශ්‍රීලකාහ |
| ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය | ශ්‍රීලංඉබ |
| ශ්‍රී ලංකා සංඥා බලකාය | ශ්‍රීලංසංබ |
| ශ්‍රී ලංකා පාබල හමුදාව | ශ්‍රීලපාහ |
| ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව | ශ්‍රීලංසිරෙ |
| ශ්‍රී ලංකා ගැමුණු හේවා බලකාය | ගැහේබ |
| ගජබා රෙජිමේන්තුව | ගරෙ |
| විජයබාහු පාබල රෙජිමේන්තුව | විපාරෙ |
| යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව | යාපාරෙ |
| කමාන්ඩෝ රෙජිමේන්තුව | කරෙ |
| විශේෂ බලකාය | විබ |
| සන්නද්ධ බුද්ධි බලකාය | සබුබ |
| ඉංජිනේරු සේවා බලකාය | ඉසේබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය | ශ්‍රීලයුසේබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය | ශ්‍රීලයුයුබ |
| ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව | ශ්‍රීලවියාඉරෙ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය | ශ්‍රීලයුවෛබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය | ශ්‍රීලයුපොහේබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය | ශ්‍රීලයුපොදුසේබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය | ශ්‍රීලයුකාබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකාය | ශ්‍රීලයුපුබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා රයිෆල් බලකාය | ශ්‍රීලංරබ |
| ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුව | ශ්‍රීලංජාආබමු |

## පෙරවදන

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූලික කාර්යභාරය වන භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කර ගැනීමට අමතරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සිය දායකත්වය සංවර්ධන ක්‍රියාවලින්ටද ලබා දී ඇත. ශ්‍රී ලංකා යුධ හමුදාව ජාතික ව්‍යසන හා හදිසි ආපදා තත්වයන්හිදි විශාල කාර්යභාරයක් සිදුකරන ලදි. 2015 ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කාර්ය සාධන වාර්ෂික වාර්තාව, ඉදිරි වර්ෂය සඳහා නිර්දේශකයන් මෙන්ම මෙම වර්ෂය පුරාවට යුද්ධ හමුදාවේ කාර්ය සාධනය සහ වාර්ෂික අයවැය වාර්තාව සපයයි. සෑම පරිච්ඡේදයකින්ම යුද්ධ හමුදා ශාඛා හා අධ්‍යක්ෂ මණ්ඩල වල දළ විශ්ලේෂණයක් හා එම අවුරුද්ද තුළ එහි ක්‍රියාකාරිත්වයේ සමාලෝචනය අන්තර්ගත වේ.

2. එම අදාල කාලය තුළ රුඃ 159,814,900,000.00 (මූලධන රුඃ 8,185,430,000.00, සහ පුනරාවර්තන රුඃ 151,629,470,000.00) ක මුදලක් මූලධන හා පුනරාවර්තන වියදම් සඳහා වෙන් කරන ලදි. මෙම වර්ෂය තුළ සිදු කරන ලද මුළු වියදම් වල වටිනාකම රුඃ 158,239,879,776.71 කි.

3. භටපිරිස් වල පුහුණුව සඳහා ප්‍රමුඛත්වය ලබාදීමෙන් සිදු කරන ලදි. මෙම වර්ෂය තුළ නිලධාරි 596 ක් හා සෙසුනිල 10,014 ක් බඳවා ගන්නා ලදි.

4. යුද්ධ හමුදාවේ උන්නතිය උදෙසා හා වඩා කාර්යක්ෂමව සේවයක් ලබා ගැනීමේ අරමුණින් යුද්ධ හමුදා වෛද්‍ය ප්‍රසම්පාදන අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා තූර්යවාදක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලය, රෝග නිවාරණ හා මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය, සයිබර් ආරක්ෂක ඒකකය, 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් භේවා බලකාය හා 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය අභිනවයෙන් ස්ථාපිත කර ඇත.

5. ඉකුත් වසර තුළදි ශ්‍රී ලංකාවට හා යුද්ධ හමුදාවට කීර්තියන් අත්කර දෙමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික මට්ටමේ තරගවලදි විශේෂ කුසලතා එළි දක්වමින් ජයග්‍රහණ කිහිපයක් අත්පත් කර ගැනීමට සමත් විය. ජාත්‍යාන්තර තරග වලදී රන් පදක්කම් 43 ක්, රිදී පදක්කම් 41 සහ ලෝකඩ පදක්කම් 48 ක් දිනා ගැනීමට යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමත් වී ඇත.

6. ශ්‍රී ලංකා යුද්ධ හමුදා මානුෂීය බිම් බෝම්බ ඉවත් කිරීමේ ඒකකය දැනට ශ්‍රී ලංකාව තුළ පවතින ප්‍රමුඛතම බිම් බෝම්බ ඉවත් කිරීමේ ආයතනය ලෙස හඳුන්වා දිය හැකිය. 2015 වසර තුළ වර්ග මීටර් 5, 713,553 ක භූමි ප්‍රමාණයක බිම් බෝම්බ ඉවත් කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා මානුෂීය බිම් බෝම්බ ඉවත් කිරීමේ ඒකකය සමත් වී ඇත.

7. සංවර්ධන කටයුතු සඳහා උපරිම දායකත්වය ලබාදුන් අතර අවතැන් වූ පුද්ගලයන් බොහෝමයක් දෙනා වෙනුවෙන් නිවාස තනාදීමෙන් හා වෙනත් අයුරින් අවශ්‍ය සහය ලබා දෙන ලදි. උදාහරණයක් ලෙස නාය යෑමෙන් අවතැන්වූ පුද්ගලයන් සඳහා නිවාස ඉදිකිරීම උපුටා දැක්විය හැකිය.

8. යුද්ධ හමුදා සාමාජිකයන්ගේ සුභසාධනය වෙනුවෙන් විශාල කාර්යභාරයක් එම වසර තුළදි සිදුකරන ලදි. යුද්ධ හමුදා මානුෂීය මෙහෙයුමේදි මියගිය හා තුවාල ලැබූ සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් උදෙසා නව සුභසාධන වැඩසටහන් කිහිපයක් ආරම්භ කරන ලද අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදා සුභසාධන වෙළඳසැල්, ලයා හොටෙල් සමූහය, ගුවන් ටිකට්පත් පුද්ගලික සේවය හා නිවාස ව්‍යාපෘති වැනි වැඩසටහන් කීපයක් ආරම්භ කිරීම තුළින් විශ්‍රාමික යුධ හමුදා සාමාජිකයන් හට සුභසාධන පහසුකම් සපයා දීම ඒ අතරින් කිහිපයක් වේ.

<u>ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආයතන ව්‍යුහය</u>

## හැඳින්වීම

1. 2015 වර්ෂය තුළදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූලික කාර්යභාරය වන යුධ හමුදා මානව සම්පත, භෞමික අඛණ්ඩත්වය ආරක්ෂා කරගැනීමට අමතරව යුද්ධ හමුදා මානව සම්පත ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහාද උපයෝජනය කිරීම තුළින් මහජන මුදල් සම්භාරයක් ඉතිරි කරදීමට සමත් විය. මෙය ආර්ථිකයට විශාල රුකුලක් වේ. එමෙන්ම රටේ හදිසි අවස්ථාවන්හිදී යුද්ධ හමුදාවේ කාර්යක්ෂම දායකත්වය කැපී පෙනෙන කරුණකි.

2. 2015 කාර්ය සාධන වාර්ෂික වාර්තාව, වාර්ෂික කාර්ය සාධනය, අයවැය වෙන් කිරීම පිළිබඳ විශ්ලේෂනාත්මක වාර්තාවක් සපයනු ලබයි. එමෙන්ම 2015 වර්ෂය තුළ සැලසුම්ගත ක්‍රියාකාරකම් සාර්ථකභාවය සම්පූර්ණ කිරීම විශ්ලේෂණය කොට 2016 වර්ෂය සැලසුම් කිරීමට බලාපොරොත්තු වේ.


### යුද්ධ හමුදා සංයුතිය

3. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා අනුමත කාර්ය මණ්ඩල සංයුතිය හා දැනට පවතින කාර්ය මණ්ඩල සංයුතිය පහත සඳහන් පරිදි වේ.

සංඛ්‍යා සටහන 1:1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංයුතිය

| | නිළධාරි | | සෙසුනිළ | |
|---|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
| නිත්‍ය බලකාය | 7,743 | 7,038 | 119,570 | 109,561 |
| ස්වේච්ඡා බලකාය | 2,898 | 2,307 | 70,149 | 62,746 |
| **එකතුව** | **10,641** | **9,345** | **189,719** | **172,307** |

ප්‍රස්ථාරය 1:1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංයුතිය.




1. **<u>රෙජිමේන්තු / බලඇණි වලට අනුව සංයුතිය</u>**. ශ්‍රී ලංකා යුද හමුදාව රෙජිමේන්තු 24 කින් සමන්විත වන අතර මෙය පාබල , සහාය හා සේවා යනුවෙන් කොටස් 03 කට වර්ග කෙරේ.

සංඛ්‍යා සටහන 1:2 රෙජිමේන්තු / බලඇණි වලට අනුව සංයුතිය

| අ/අ | රෙජිමේන්තුව | නිත්‍ය | | ස්වේච්ඡා | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|
| | | නිලධාරී | සෙසු නිල | නිලධාරී | සෙසු නිල | නිලධාරී | සෙසු නිල |
| 1 | ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය | 266 | 4360 | 35 | 598 | 301 | 4958 |
| 2 | ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව | 387 | 5969 | 69 | 1186 | 456 | 7155 |
| 3 | ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය | 296 | 6107 | 41 | 1417 | 337 | 7524 |
| 4 | ශ්‍රී ලංකා සංඥා බලකාය | 308 | 4956 | 22 | 493 | 330 | 5449 |
| 5 | ශ්‍රී ලංකා පාබල හමුදාව | 429 | 9454 | 172 | 3747 | 601 | 13201 |
| 6 | ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව | 468 | 9773 | 151 | 4139 | 619 | 13912 |
| 7 | ගැමුණු හේවා බලකාය | 466 | 9678 | 166 | 3527 | 632 | 13205 |
| 8 | ගජබා රෙජිමේන්තුව | 456 | 10008 | 185 | 4101 | 641 | 14109 |
| 9 | විජයබාහු පාබල රෙජිමේන්තුව | 431 | 8863 | 152 | 3687 | 583 | 12550 |
| 10 | යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව | 152 | 2546 | 22 | 482 | 174 | 3028 |
| 11 | කමාන්ඩෝ රෙජිමේන්තුව | 191 | 3004 | - | - | 191 | 3004 |
| 12 | විශේෂ බලකාය | 159 | 2575 | - | - | 159 | 2575 |
| 13 | සන්නද්ධ බුද්ධි බලකාය | 129 | 2635 | 36 | 893 | 165 | 3528 |
| 14 | ඉංජිනේරු සේවා බලකාය | 128 | 3069 | 111 | 10097 | 239 | 13166 |
| 15 | ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය | 153 | 4211 | 26 | 835 | 179 | 5046 |
| 16 | ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය | 250 | 4019 | 18 | 513 | 268 | 4532 |
| 17 | ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය | 135 | 3233 | 13 | 362 | 148 | 3595 |
| 18 | ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව | 164 | 3594 | 22 | 1472 | 186 | 5066 |
| 19 | ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය | 146 | 3269 | - | - | 146 | 3269 |
| 20 | ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය | 271 | 3060 | 176 | 1944 | 447 | 5004 |
| 21 | ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය | 58 | 758 | 91 | 2393 | 149 | 3151 |
| 22 | ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකාය | - | - | 43 | 1224 | 43 | 1224 |
| 23 | ශ්‍රී ලංකා යුද්ධ හමුදා රයිෆල් බලකාය | - | - | 30 | 1073 | 30 | 1073 |
| 24 | ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව | - | - | 580 | 13574 | 580 | 13574 |
| | **එකතුව** | **5443** | **105141** | **2661** | **57757** | **7604** | **162898** |

ප්‍රස්ථාරය 1:2 රෙජිමේන්තු වලට අනුව සංයුතිය.




නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## 2015 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම


1. 2015 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුගත කිරීම් අනුව රාජ්‍ය භාණ්ඩාගාරය විසින් පුනරාවර්ථන හා මූලධන වියදම් සඳහා වෙන් කරන ලද අයවැය වෙන්කිරීම් පහත සඳහන් පරිදි වේ.

සංඛ්‍යා සටහන 2:1 2015 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම.

| වැය ශිර්ෂය | විස්තරය | 2015 වර්ෂය සඳහා මුළු ප්‍රතිපාදන රු. | 2015.12.31 දිනට සත්‍ය වියදම රු. | 2015.12.31 දිනට සත්‍ය ඉතිරිය රු. |
|---|---|---|---|---|
| **පුනරාවර්ථන වියදම** | | | | |
| 1001-1003 | පුද්ගලික වැටුප් | 117,006,200,000.00 | 117,003,050,317.75 | 3,149,682.25 |
| 1101-1508 | වෙනත් පුනරාවර්ථන | 34,623,270,000.00 | 34,621,516,379.09 | 1,753,620.91 |
| | **එකතුව** | **151,629,470,000.00** | **151,624,566,696.84** | **4,903,303.16** |
| ප්‍රාග්ධන වියදම් | | | | |
| **පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ ප්‍රාග්ධන වත්කම්** | | | | |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 243,300,000.00 | 240,231,983.40 | 3,068,016.60 |
| 2002 | බලාගාර, යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 143,500,000.00 | 143,499,965.71 | 34.29 |
| 2003 | වාහන | 150,000,000.00 | 148,965,798.76 | 1,034,201.24 |
| **ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | |
| 2101 | වාහන | 219,382,400.00 | 219,382,346.63 | 53.37 |
| 2102 | ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ | 291,100,000.00 | 289,957,698.17 | 1,142,301.83 |
| 2103 | බලාගාරය, යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 606,028,600.00 | 606,028,509.27 | 90.73 |
| 2104 | ගොඩනැගිලි හා ඉදි කිරීම් | 1,351,800,000.00 | 1,331,560,963.25 | 20,239,036.75 |
| 2105 | ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම | 333,800.00 | 333,772.00 | 28.00 |
| 2401 | පුහුණු හා ධාරිතා | 995,825,200.00 | 995,331,941.52 | 493,258.48 |
| | **එකතුව** | **4,001,270,000.00** | **3,975,292,978.71** | **25,977,021.29** |
| 2502 | වෙනත් ආයෝජන | 1,880,160,000.00 | 1,880,159,758.89 | 241.11 |
| 2502 | වෙනත් ආයෝජන (ක්‍රෙඩිට් අතුරු මුහුණත) | 2,304,000,000.00 | 759,860,342.27 | 1,544,139,657.73 |
| | **එකතුව** | **4,184,160,000.00** | **2,640,020,101.16** | **1,544,139,898.84** |
| **මුළු එකතුව** | | **159,814,900,000.00** | **158,239,879,776.71** | **1,575,020,223.29** |

## 2015 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම.

ප්‍රස්ථාරය 2:1 අයවැය වෙන් කිරීම සහ වියදම.




නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## අභිනවයෙන් ස්ථාපිත සංස්ථා හා ආයතන

1. **යුද්ධ හමුදා වෛද්‍ය ප්‍රසම්පාදන සේවා අධ්‍යක්ෂ මණ්ඩලය**. යුද්ධ හමුදා වෛද්‍ය ප්‍රසම්පාදන සේවා අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාපිත කිරීමේ අරමුණ වන්නේ වෛද්‍ය හා දන්ත වෛද්‍ය උපකරණ, ඖෂධ හා සියළුම වෛද්‍ය උපකරණ සැපයීම තුළින් කාර්යක්ෂම හා ඵලදායී වෛද්‍ය සේවයක් යුද්ධ හමුදා සාමාජිකයින්ට, විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයින්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට ලබාදීමය.



2. **යුද්ධ හමුදා තූර්යවාදක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලය**. යුද්ධ හමුදා තූර්යවාදක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලයෙහි කාර්යභාරය වනුයේ සංගීතය තුළින් යුද්ධ හමුදාවේ ශක්තිය තිරසාර ලෙස සංවර්ධනය කිරිම හා රාජ්‍ය උත්සව අවස්ථාවන්හිදී සංගීතය සැපයීම හා යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සංගීත රසාස්වාදය වැඩිදියුණු කිරීමයි.



3. **නිවාරක වෛද්‍ය හා මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය**. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාපිත කිරීමේ අරමුණ වන්නේ යුද්ධ හමුදා සාමාජිකයින්ට, විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයින්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට රෝග නිවාරණ සේවා හා මානසික සෞඛ්‍ය සේවා සැපයීමයි.



4. **14 වන ඉංජිනේරු රෙජිමේන්තුව**. 14 වන ස්වාධීන ඉංජිනේරු රෙජිමේන්තුව ලෙස නැවත ස්ථාපිත කිරීම. මෙම රෙජිමේන්තුව ස්ථාපිත කිරීමේ අරමුණ වන්නේ උපසාම්ප්‍රදායික යුද මෙහෙයුම් සඳහා කාර්යක්ෂම අයුරින් සහාය දීමයි.



5. <u>**12 වන ශ්‍රී ලංකා සංඥා බලකාය.**</u> ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා ආරක්ෂිත සයිබර් අවකාශයක් නිර්මාණය කිරීම තුළින් ඒ හා සම්බන්ධ නියෝග, පාලනය, පරිපාලනය සඳහා දායකත්වය සැපයීම 12 වන සංඥා බලකාය ස්ථාපිත කිරීම අරමුණ වේ.



6. <u>**7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය.**</u> විනයාරක්ෂක සේවා සැපයීම හා සිවිල් පොලීසියෙන් වෙන් වී පවතින යුද්ධ හමුදා ජනපද හා ප්‍රදේශ වල අපරාධ මර්ධන කටයුතු, මහාමාර්ග තදබදය අවම කිරීම ආදී පොලිස් රාජකාරි කටයුතු සිදුකිරීමේ මූලික පරමාර්ථය පෙරදැරිව මෙය ස්ථාපිත කර ඇත.




7. <u>**5 වන සංඥා බලකාය සංඥා බලකායට ආවේණික බලකායක් බවට පත්කිරීම.**</u> මෙමගින් නියෝග, පාලන හා පරිපාලන කටයුතු වලදී අවශ්‍ය වන සන්නිවේදන පහසුකම් පුළුල් කිරීම බලාපොරොත්තු වේ.

8. <u>**6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය.**</u> ශ්‍රී ලංකා යුද හමුදාව තුල වෛද්‍ය සේවය පුළුල් කිරීමේ අරමුණින් මෙම රෙජිමේන්තුව ස්ථාපිත කරන ලදී.



9. <u>**6 වන ශ්‍රී ලංකා සංඥා බලකාය තොරතුරු තාක්ෂණ ඒකකයක් බවට පරිවර්ථනය කිරීම.**</u> නියෝග, පාලනය, පරිපාලන කටයුතු වලදී අවශ්‍ය වන තොරතුරු තාක්ෂණ සහය ලබා දීමේ හැකියාව පුළුල් කිරීමේ අරමුණින් මෙම ඒකකය ප්‍රතිෂ්ඨාපනය කරන ලදී.

## මානුෂීය බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය

1. **මානුෂිය බිම්බෝම්බ ඉවත් කිරිම.** ශ්‍රී ලංකාවේ දැනට පවතින බිම්බෝම්බ නිෂ්ක්‍රීය කිරිම සඳහා ඇති ආයතන අතුරින් වැඩි දායකත්වයක් ලබාදෙන ඒකකය වනුයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා බිම්බෝම්බ නිෂ්ක්‍රීය ඒකකයයි. බිම්බෝම්බ නිෂ්ක්‍රීය කිරිමේ ක්‍රියාකාරකම් වේගවත් කිරිම තුළින් උතරු - නැගෙනහිර ජන ජීවිතය යථා තත්වයට ගෙන ඒමට රජයට සහය ලබා දී ඇත. 2015 වර්ෂය තුළ මෙම ඒකකයට නැවත ලියාපපදිංචි කරවීමේ අමාත්‍යාංශයේ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් රුඃ මිලියන 50 ක අරමුදල් ලැබී ඇත. 2015 වර්ෂය තුළ ශ්‍රී ලංකා යුද්ධ හමුදා බිම්බෝම්බ ඉවත් කිරිමේ ඒකකය විසින් බිම්බෝම්බ ඉවත් කරන ලද භුමි ප්‍රමාණය වර්ග මීටර් 5,713,533 කි.



හඨපිරිස් මගින් බිම් බෝම්බ ඉවත් කිරිම



යන්ත්‍ර මගින් බිම්බෝම්බ ඉවත් කිරිම

2. මෙම කාලය තුල ක්ෂේත්‍ර ඉංජිනේරු බලකායට අයත් ඒකක වල සැලකිය යුතු භට පිරිසක් මෙම ක්‍රියාකාරකම් හා සම්බන්ධ වී ඇත. ඉතා කඩිනමින් ඉටු කලයුතු රාජකාරි ඉටු කිරිම සඳහා වර්ථමානයේ 1286 ක බිම්බෝම්බ නිෂ්ක්‍රියකරුවන් පිරිසක් යොදවා ඇති අතර මොවුන් ඉංජිනේරු බලකාය යටතේ ක්‍රියාත්මක වේ. ජාත්‍යන්තර තත්වයට අනුකුල වන පරිදි සිදු කිරිම විශාල තාක්ෂණික දායකත්වයක් එක්සත් ජාතින්ගේ සංවර්ධන ව්‍යාපෘති තුලින් ලැබී ඇත.



බිම්බෝම්බ ඇති ප්‍රදේශ සළකුණු කිරිම




ඇමරිකානු හමුදාව සමග සිදුකරන ලද පුපුරණ ද්‍රව්‍ය ඉවත් කිරිමේ පුහුණුව


3. ශ්‍රී ලංකාවේ බිම් බෝම්බ ඇති ප්‍රදේශ ලෙස 2015 සැප්තැම්බර් 30 වන විට වර්ග මීටර් 64,402,238 ක බිම් ප්‍රමාණයක් හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2015 ජනවාරි 01 සිට 2015 දෙසැම්බර් 31 දක්වා බිම් බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාකාරකම් තුලින් ලද ප්‍රගතිය පහත පරිදි වේ.

ප්‍රස්ථාරය 5:1 2015.12.31 දිනට බිම් බෝම්බ ඉවත් කිරීමේ ප්‍රගතිය.

<u>බිම් බෝම්බ ඇති බවට මූලිකව හදුනාගත් ප්‍රදේශ</u>




<u>වර්තමාන තත්ත්වය</u>




ප්‍රස්ථාරය 5:1 ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ අනෙකුත් ආයතන විසින් බිම් බෝම්බ ඉවත් කරන ලද ප්‍රදේශ.

| අනු අංකය | ඉවත් කිරීමේ ආයතනය | සමුච්චිතය (2002 සිට 2015 දෙසැම්බර් දක්වා) | | | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|
| | | වර්ග මීටර් | වර්ග මීටර් | එකතුව | |
| **1** | **ශ්‍රී ලංකා යුද හමුදාව** | **1,286,440** | **4,427,113** | **5,713,553** | **73.08** |
| 2 | හෙලෝ ට්‍රස්ට් සංවිධානය (HALO Trust) | 335,080 | 879,825 | 1,214,905 | 15.54 |
| 3 | මැග් සංවිධානය (MAG) | - | 374,072 | 374,072 | 4.78 |
| 4 | ඩෑෂ් සංවිධානය (DASH) | - | 516,151 | 516,151 | 6.60 |
| | **එකතුව** | **1,621,520** | **6,197,161** | **7,818,681** | **100** |

4. එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදල වෙතින් අරමුදල් යොදවා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව භටපිරිස් සඳහා පුහුණුව ලබාදීම තුළින් බිම් බෝම්බ ඇති ප්‍රදේශ වල ජීවත් වන ජනතාවගේ ආරක්ෂාව සඳහා බිම් බෝම්බ අවධානම පිළිබඳ අධ්‍යාපනිත වැඩසටහන් මෙහෙයවීම අපේක්ෂා කරයි.



බිම් බෝම්බ අවධානම පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන - නගරකෝවිල්




බිම් බෝම්බ අවධානම පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන - මුලතිව්

සංඛ්‍යා සටහන 5:2 බිම් බෝම්බ අවධානම පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන් සඳහා සහභාගී වූ පුද්ගල සංඛ්‍යාව

| සහභාගී වූ පුද්ගල සංඛ්‍යාව | | | | | | |
|---|---|---|---|---|---|---|
| අ/අ | දිස්ත්‍රික්කය | වැඩිහිටියන් | | ළමයින් | | එකතුව |
| | | පිරිමි | ගැහැණු | පිරිමි | ගැහැණු | |
| 1 | පොළොන්නරුව | 17 | 30 | 16 | 10 | 73 |
| 2 | යාපනය | 50 | 45 | 12 | 8 | 115 |
| 3 | මුලතිව් | 368 | 382 | 138 | 167 | 1055 |
| | **එකතුව** | **435** | **457** | **166** | **185** | **1243** |

5. බිම් බෝම්බ හඳුනා ගැනීමේ සුනඛයින්. නිවැරදි තත්ත්වයන්ට අනුකූලව බිම් බෝම්බ හඳුනා ගැනීමේ සුනඛයින් යොදා ගැනිම වඩා ලාභදායී හා කාර්යක්ෂම ක්‍රමවේදයක් වේ. අවම වානේ සංයුතියක් ඇති බිම් බෝම්බ හඳුනා ගැනීමට සහ අධික වානේ සාන්ද්‍රණයකින් යුතු ප්‍රදේශ වල බිම් බෝම්බ ඇති ස්ථාන හඳුනා ගැනීමේදි මුහුණ පෑමට සිදුවන ගැටළු වලට මෙය කදිම විසඳුමක් වේ. ඒ අනුව බිම් බෝම්බ හඳුනා ගැනීමේ සුනඛයින් සංඛ්‍යාව 20 දක්වා වැඩි කරන ලදි.



බිම් බෝම්බ හඳුනා ගැනීමේ සුනඛයින්

## යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සුභසාධනය

1. 2015 වර්ෂය තුළ ක්‍රියාවට නංවන ලද සුභසාධන ව්‍යාපෘති පහත පරිදි වේ.

අ. **ණය යෝජනා ක්‍රම**. මුල්‍ය ණය රුඃ 50,000.00, 100,000.00, 300,000.00 ආදී වශයෙන් නිවාස ණය ලෙස ලබා දෙන ලදි. මීට අමතරව ගුවන් ටිකට්පත් ණය හා වාහන ණය යෝජනා ක්‍රම ස්ථාපිත කරන ලදි. මෙමගින් 2337 ක සාමාජිකයින් ප්‍රමාණයක් ප්‍රතිලාභ ලබා ගෙන ඇත.

ආ. **ඉඩම් ව්‍යාපෘති**. සුභසාධන යෝජනා ක්‍රමය යටතේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් ඉඩම් කැබලි 90 ක් (පර්චස් 20 ක ප්‍රමාණයක්) බෙදා දෙන ලදි. එක් නිළධාරියෙකු සහ සෙසුනිළ 89 ක් ප්‍රතිලාභ ලබා ගන්නා ලදි.

ඇ. **සුවසහන අරමුදල**. එම වර්ෂය තුළ සුවසහන ණය යෝජනා ක්‍රමය යටතේ යුද්ධ හමුදා සාමාජිකයින් 7450 ක් ප්‍රතිලාභ ලබා ඇත.

ඈ. **ශ්‍රී ලංකා යුද්ධ හමුදා නීති ආධාර අරමුදල**. 2015.01.01 සිට 2015.12.31 දක්වා කාලය තුළ සාමාජිකයින් 07 දෙනෙකු මුදලින් රුඃ620,000.00 ක නීති ආධාර අරමුදල යටතේ ප්‍රතිලාභ ලබා ඇත.

ඉ. **සුවසහන බස් රථ සේවය**. සාමාජිකයින් 290 මෙම සේවය තුළින් ප්‍රතිලාභ ලබා ඇත.



සුවසහන බස් රථ සේවය

ඊ. **යුද්ධ හමදා මරණාධාර ප්‍රතිපූර්ණය**. රුඃ6,990,000.00 ක මුදලක් මගින් සාමාජිකයින් 149 දෙනෙක් මෙම වර්ෂය තුළදි ප්‍රතිලාභ ලබා ඇත.

උ. **ලායා හොටල් සමූහය**. යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා මානසික පීඩනයකින් තොර වු පරිසරයක් නිර්මාණය කිරිම උදෙසාත් ඔවුන් සඳහා විවේකය ලබාදීමේ අරමුණින් හා යුද්ධ හමුදා සාමාජිකයින්ට සාධාරණ මිළකට ඔවුන්ගේ නිවාඩුව ගත කිරීමට පහසුකම් සැළසීම උදෙසා මෙම හෝටල් සමූහය නිර්මාණය කරන ලදි.



ලායා හෝටලය - කල්කුඩා



ලායා සෆාරි හෝටලය - යාල



ලායා බීච් හෝටලය - වාද්දුව

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ව්‍යාපෘති

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, දීපව්‍යාප්තව සිදු කරන ලද ඉදිකිරීම් ප්‍රතිසංස්කරණය සහ බිම් සැකසීම ආදී සංවර්ධන ව්‍යාපෘති රාශියක් සඳහා දායකත්වය ලබා දෙන ලදි. එම ව්‍යාපෘති වලින් කිහිපයක් පහත දැක්වේ.



විවෘත භූමි වේදිකාව - මොරටුව විශ්ව විද්‍යාලය



ක්‍රීඩා සංකීර්ණය - රාජකීය විද්‍යාලය කොළඹ 07




වෙළඳ ගොඩනැගිල්ල - රාජකීය විද්‍යාලය කොළඹ 07



ගෘහස්ත ක්‍රීඩාගාරය (II වන අදියර) - සිරිමාවෝ බණ්ඩාරණායක විද්‍යාලය



සති පොළ - චාවකච්චේරිය



දුම්රිය අවන්හල - දියත උයන



සති පොළ - කුලියාපිටිය



සඳහිරු සෑය ව්‍යාපෘතිය - අනුරාධපුරය



ජාතික කෞතුකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම



ත්‍රිවිධ හමුදා මූලස්ථාන සංකීර්ණය - බත්තරමුල්ල



ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨ ශ්‍රවණාගාරය



මූණමල්වත්ත එල්ලෙන පාලම

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා හදිසි ආපදා කළමනාකරණ මෙහෙයුම්

### 1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් නේපාලයේ සිදු කරන ලද සහන මෙහෙයුම්.



2015 අප්‍රේල් 25 වන දින නේපාලයේ භූමි කම්පාවෙන් අවතැන් වූ සහන සැළසීම සඳහා ශ්‍රී ලංකා රජය පියවර ගන්නා ලදි. යුද්ධ හමුදා සමාජිකයින් 72 කින් යුත් සහන කණ්ඩායමක් සහන සැළසීමට අවශ්‍ය භාණ්ඩ තොගයක් සමග එරටට පිටව යන ලදි. මෙම සහන කණ්ඩායම භූමි කම්පාව හේතුවෙන් විශාල ලෙස අලාභ හානියට පත් වූ ප්‍රදේශවල සති 02 ක කාලයක් පුරාවට ගලවා ගැනීමේ සහ සහන සැළසීමේ මෙහෙයුම් වල යෙදෙන ලදි.



නේපාල භූමි කම්පාව සිදු වූ අවස්ථාවේදී ඉතා කඩිනමින් විදේශීය සහන මෙහෙයුම් දියත් කරන ලද්දේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසිනි. මෙය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නව මුහුණුවරකි.









හදිසි ආපදා සහන මෙහෙයුම - කත්මණ්ඩු, නේපාලය

## යුධ සේවා ලේකම් ශාඛාව

1. මේජර් ජෙනරාල් නිලය හොබවන ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්ගෙන් අයෙකු වන යුද සේවා ලේකම් යටතේ යුද සේවා ලේකම් ශාඛාව පාලනය වේ. යුද හමුදාවේ නිලධාරීන් සබැඳිව මානව සම්පත් කළමනාකරණ රාජකාරී මෙම ශාඛාව මගින් සිදුකරනු ලැබේ.

**2015 වර්ෂය තුළ කාර්ය සාධනය**

2. පහත සඳහන් නිල උසස් කිරීම් මණ්ඩල මෙම ශාඛාව විසින් සම්පූර්ණ කර ඇත.

සංඛ්‍යා සටහන 9:1 නිළධාරි නිළ උසස් කිරිමේ විස්තරය -2015.

| අ/අ | විස්තරය | නිළ උසස් කිරිම සඳහා සළකා බලන ලද නිළධාරින් සංඛ්‍යාව | | නිළ උසස් වු නිළධාරින් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | | නිත්‍ය | ස්වේච්ඡා | නිත්‍ය | ස්වේච්ඡා |
| 1 | 2/ලුතිනන් සිට ලුතිනන් (මණ්ඩල 6) | 290 | 115 | 157 | 80 |
| 2 | ලුතිනන් සිට කපිතන් (මණ්ඩල 14) | 1067 | 407 | 617 | 285 |
| 3 | කපිතන් සිට මේජර් (මණ්ඩල 8) | 275 | 115 | 91 | 50 |
| 4 | මේජර් සිට තා/ලුතිනන් කර්නල්(මණ්ඩල 1) | 102 | - | 50 | - |
| 5 | ලුතිනන් කර්නල් සිට තා/කර්නල්(මණ්ඩල 1) | 01 | - | 01 | - |
| 6 | කර්නල් සිට තා/බ්‍රිගේඩියර් (මණ්ඩල 1) | 01 | - | 01 | - |
| 7 | බ්‍රිගේඩියර් සිට තා/මේජර් ජෙනරාල්(මණ්ඩල 2) | 62 | - | 10 | - |
| | **එකතුව** | **1798** | **637** | **927** | **415** |

3. මෙම වර්ෂය තුළදි නිත්‍ය නිළධාරින් 637 හා ස්වේච්ඡා නිළධාරින් 03 ක් වර්ථමාන නිළය තහවුරු කරන ලදි.

4. මෙම වර්ෂය තුළදි නිත්‍ය නිළධාරින් 130 හා ස්වේච්ඡා නිළධාරින් 41 ක් 'තෝරා ගත් මේජර් ලැයිස්තුවට' ඇතුළත් කරන ලදි .

5. යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් පරිදි යුද්ධ හමුදාවේ දියුණුව කෙරෙහි පැන නැගිය හැකි ගැටළු අධ්‍යනය කර ඒවාට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරිම සඳහා පරිපාලන මණ්ඩල 18 ක් පත් කරන ලදි.

6. යුධ සේවා ලේකම් ශාඛාව විසින් නිළධාරින් 2232 අර්ධ වාර්ෂික පත්කිරිම් සැළසුම් කර ප්‍රකාශයට පත් කර අධීක්ෂණය කරන ලදි.

7. 2014/2015 වර්ෂයේ විශ්‍රාම ගත් නිළධාරින් සංසන්දනාත්මකව ගත කල පහත පරිදි වේ.

සංඛ්‍යා සටහන 9:2 2014/2015 වර්ෂවල විශ්‍රාම ගත් නිළධාරින් සංසන්දනය.

| අ/අ | නිළය | 2014 | 2015 |
|---|---|---|---|
| 1 | 2 ලුතිතන් | 13 | 16 |
| 2 | ලුතිතන් | 163 | 93 |
| 3 | කපිතන් | 49 | 84 |
| 4 | මේජර් | 94 | 112 |
| 5 | ලුතිතන් කර්නල් | 21 | 17 |
| 6 | කර්නල් | 5 | 13 |
| 7 | බ්‍රිගේඩියර් | 5 | 5 |
| 8 | මේජර් ජෙනරල් | 8 | 6 |
| 9 | ජෙනරල් | - | 2 |
| | **එකතුව** | **358** | **348** |


8. **නිළ උත්සව සංවිධානය.** යුද සේවා ලේකම් ශාඛාව විසින් සිව්වන අන්තර් හමුදා මාණ්ඩලික සාකච්ඡා වැඩසටහන සංවිධානය කරන ලදි. එමෙන්ම ඉන්දියානු නියෝජිත පිරිස ශ්‍රී ලංකාවේ සංචාරය කල අවස්ථාවේදි 2015 මාර්තු 02 වන දා සිට 2015 මාර්තු 04 වන දා දක්වා සාකච්ඡා මෙහෙය වන ලදි. එම සාකච්ඡා වලදි එකග වු පරිදි නිළධාරින්/උපදේශකවරුන් හුවමාරු කරගැනිම පුහුණු පාඨමාලා දියත් කිරිම වැනි විවිධ ක්‍රියාකාරකම් යුද්ධ හමුදා මුලස්ථානයට අයත් අනෙකුත් ශාඛා සහ අධ්‍යක්‍ෂ මණ්ඩල වල සහයෝගය ඇතිව සම්බන්ධිකරණය කරන ලදි.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

**<u>ප්‍රධාන මාණ්ඩලික ශාඛාව</u>**

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා මුලස්ථානයේ ප්‍රධාන ශාඛාවක් ලෙස මෙම ශාඛාව හැඳින්විය හැකි අතර ප්‍රධාන මාණ්ඩලික ශාඛාවේ මූලිකම වගකීම වනුයේ මෙහෙයුම් සම්බන්ධිකරණය සහ යුද්ධ හමුදා සාමාජිකයින්ගේ පුහුණුවයි. අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික විසින් මෙම ශාඛාවේ ප්‍රධාන මුලසුන හොබවන අතර ඔහු මේජර් ජෙනරල් නිලය හොබවන ප්‍රධාන මාණ්ඩලික නිළධාරින් 07 දෙනාගෙන් එක් අයෙකු වේ. අධ්‍යක්ෂ මණ්ඩල 10 ක් හා බල සේනා මුලස්ථාන 04 ක් මෙම ශාඛාව යටතේ ක්‍රියාත්මක වේ.

රූප සටහන 10:1 ප්‍රධාන මාණ්ඩලික ශාඛාව යටතේ ඇති ආයතන.




2. **<u>සක්‍යතා සංවර්ධන ක්‍රියාකාරකම්.</u>** මෙම වසර තුළ හැකියා වර්ධන වැඩසටහන් ආරම්භ කිරිම සඳහා මෙම ශාඛාව මුලිකත්වය ගත් අතර කර්මාන්ත ක්ෂේත්‍රය පුළුල් කිරීමේ අරමුණින් යුද්ධ හමුදා කර්මාන්ත ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි.

3. පුපුරණ ද්‍රව්‍ය හඳුනා ගැනීමේ සුනඛයන්ගේ අංශයක් ස්ථාපිත කිරීමත් සමග මානුෂිය බිම් බෝම්බ ඉවත් කිරිමේ ක්‍රියාකාරකම්වල විශාල දියුණුවක් දැක ගත හැකි විය.

4. මීට අමතරව මානුෂීය බිම් බෝම්බ ඉවත් කිරිම පිළිබඳ පාඨමාලා එක්සත් ජනපද තානාපති කාර්යාලය හා සම්බන්ධව සිදුකරන ලදි.

5. **ක්‍රියාකාරකම් ඇගයීම හා විශ්ලේෂණය.** ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලය යටතේ සිටින භට පිරිස් විසින් සිදු කරනු ලබන ඉංජිනේරු ව්‍යාපෘති වල විශාල දියුණුවක් දැක ගත හැකි වු අතර සිවිල් ආයතන වලින් ඉංජිනේරු කාර්යයන් සඳහා වන ඉල්ලුමෙහි වැඩිවීමක් මෙම කාලය තුළ දක්නට ලැබිණි. පුහුණු වෘත්තිකයිගේ හිගයක් හදුනා ගන්නා ලද අතර මෙම තතත්වය කර්මාන්ත ක්ෂේත්‍රය තුළ කැපී පෙනේ. තවද බිම් බෝම්බ ඉවත් කිරිම සඳහා භාවිතා කරන උපකරණ වල හිගයක් පැවතීම බිම් ඉවත් කිරිමේ ක්‍රියාකරකම් වල කාර්යක්‍ෂමතාවය කෙරෙහි සෘණාත්මකව බලපාන ලදි.

6. **අභියෝග.** අභියෝගාත්මක ක්ෂේත්‍ර ලෙස ඉංජිනේරු ක්ෂේත්‍රය සහ කර්මාන්ත ඉදිකිරිමේ ක්ෂේත්‍රය හදුනා ගන්නා ලදි. ඉංජිනේරු උපකරණ ඉතා ඉක්මනින් අබලන් විම සහ පුහුණු වෘත්තිකයන්ගේ හිගකම මෙම කාර්යයන්හි කාර්යක්‍ෂම තාවයට අහිතකර ලෙස බලපා ඇත. එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා අනුයුක්ත කර ඇති භට පිරිස් වලට විවිධ අභියෝග වලට මුහුණ දීමට සිදු විය. විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා බලාපොරොත්තු වන තත්ත්වයට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සතු යන්ත්‍ර සහ උපකරණ වල තත්ත්වය නොගැලපීම නිසා විවිධ දුෂ්කරතා වලට මුහුණපෑමට සිදු විය.

7. රසායන, ජීව විද්‍යාත්මක, විකිරණ, න්‍යෂ්ඨික බලසෙණ සඳහා පුහුණුව ලබාදිමේදි (Mission Oriented Protective Posture) අවශ්‍ය උපකරණ වල හිගතාවය නිසා ඒ ඒ අධියරයන් වල අවස්ථාවලට ප්‍රතිචාර දැක්විමට නොහැකි වි තිබේ.

8. එමෙන්ම, උපකාරක අවි සඳහා ප්‍රයෝගික පුහුණුව ලබා දිමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සතුව ක්ෂේත්‍ර වෙඩිපිටියක් නොමැතිකම හේතුවෙන් වර්ථමානයේදි ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු කල්පිටිය වෙඩිපිටියේදි බල ඇණි උපකාරක අවි වෙඩි තැබිම් පුහුණු කරයි.

9. ඉංජිනේරු බලසේනාව යටතේ පවතින මෙහෙයුම් පරිපාලන හා පාලන කටයුතු වල බහුලත්වය හේතුවෙන් දෙවන ඉංජිනේරු බලසේනාවක් ස්ථාපිත කිරිමේ අවශ්‍යතාවය මෙම වසර තුළ හදුනා ගන්නා ලදි.

10. සයිබර් ආරක්ෂක ක්‍රම වල වැඩි දියුණු කිරිම සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් දැනුවත් කිරිමේ වැඩ සටහන් මෙහෙයවිම මගින් තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ මණ්ඩලය දැඩි ප්‍රයත්නයක් ගන්නා ලදි.

11. **සාක්ෂාත් කර ගත නොහැකි වු ඉලක්කයන්.** අධ්‍යක්‍ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික ශාඛාව විසින් මෙම වර්ෂය තුළ සාක්ෂාත් කර ගත නොහැකි වු ඉලක්කයන් ලෙස පහත දැක්වෙන ඉලක්කයන් හදුනා ගන්නා ලදි.

අ. භූ ආකාශ ඉංජිනේරු බළකායක් ස්ථාපිත කිරිම සඳහා සංස්ථාවක් නිර්මාණය කර එය ඉදිරි කාලයේදි නිකුත් කිරිමට පියවර ගෙන ඇත.

ආ. මාර්ග ඉදිකිරිමේ කටයුතු වලදි තාර ඇතිරිම සඳහා යුද්ධ හමුදාවට පරිභාහිර පුද්ගලයින් සහ ආයතන සම්බන්ධ කර ගැනිම අවම කරගැනිම තුළින් පිරිවැය අවම කරගැනිම යථාර්ථයක් බවට පත් කර ගැනිමට තවම නොහැකිව ඇත.


12. **අනාගත සැළසුම්.** පුපුරා නොගිය ද්‍රව්‍ය, ක්ෂණිකව සාදනු ලබන පුපුරණ උපකරණ (Improvised Explosive Devices), මහා පරිමාණ විනාශකාරි ආයුධ වලින් සිදු විය හැකි හානිය වළක්වා ගැනිම සඳහා අධීක්‍ෂණ කටයුතු සිදු කිරිමට සැළසුම් කර ඇත.

13. ජාත්‍යන්තර ප්‍රජාවගේ උපදේශණය සහිතව බිම්බෝම්බ ඉවත් කිරිමේ පළපුරුදු සාමාජිකයින් විදේශීය මෙහෙයුම් සඳහා අනුයුක්ත කිරිමට සැළසුම් කර ඇත.

**<u>ක්‍රියාන්විත අධ්‍යක්‍ෂ මණ්ඩලය</u>**

14. ක්‍රියාන්විත අධ්‍යක්‍ෂ මණ්ඩලය හමුදා මෙහෙයුම් හා සම්බන්ධ මාණ්ඩලික රාජකාරි, මෙහෙයුම් සංකල්ප හඨපිරිස් සැළසුම්කරණය සහ මෙහෙයුම් නියෝග සහ උපදෙස් නිකුත් කිරීම සඳහා වගකියනු ලැබේ.

<u>ආරක්‍ෂක සේනා මූලස්ථාන යටතට අයත් ප්‍රදේශ.</u>



15. **ප්‍රධාන ක්‍රියාකාරකම් හා ඒවායේ ප්‍රගතිය.** ගවේෂණ හා මුදවා ගැනිමේ යුද්ධ හමුදා කණ්ඩායම් 55 ක් නවින උපකරණ සහිතව දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි හදිසි ආපදා තත්වයකදි ඉතා කඩිනමින් ක්‍රියාත්මක විම සඳහා අනුයක්ත කර ඇත. යුද්ධ හමුදා හඨ පිරිස් දේශීය හා විදේශීය හදිසි ආපදා තත්ව වලදි ප්‍රතිචාර දැක්විමේ වැඩ සටහන් අනුයුක්ත කිරිම, සම්බන්ධීකරණය කිරිම කරන ලද අතර මුදවා ගත් පිරිස් සඳහා අත්‍යාවශ්‍ය දෑ සම්පාදනය කරදීමටද කටයුතු කරන ලදි.

16. වර්ථමානයේදි සාමසාධක රාජකාරි සඳහා දැඩි ඉල්ලුමක් පවති. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෘත්තීය නිපුණත්වයෙන් යුත් අත්දැකීම් බහුල ආයතනයක් ලෙස සාම සාධක රාජකාරි සඳහා වඩා උසස් දායකත්වයක් ලබාදීමට හැකියාව ලැබි ඇත. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සාම සාධක රාජකාරි සඳහා අනුයුක්ත කරන ලද හඨපිරිස් සංඛ්‍යාව පහත පරිදි වේ.

අ. නිළධාරින් 10 ක් සහ සෙසු නිළයින් 140 ක් (9 වන ආරක්‍ෂක කණ්ඩායම) 2015.02.06 වන දින සිට වසරක කාලසීමාවක් සඳහා ලෙබනන්හි ක්‍රියාත්මක සාම සාධක රාජකාරි සඳහා අනුයුක්ත කරන ලදි.

ආ. නිළධාරින් 15 ක් සහ සෙසු නිළයින් 50 ක් (2 වන යුද්ධ හමුදා රෝහල 3 වන අදියර) 2015.05.26 වන දින සිට වසරක කාලසීමාවක් සඳහා දකුණු සුඩානය ක්‍රියාත්මක සාම සාධක රාජකාරි සඳහා අනුයුක්ත කරන ලදි.

17. මෙම වර්ෂය තුළදි මාණ්ඩලික නිළධාරින් සහ යුද්ධ හමුදා නිරීක්‍ෂකයින් ලෙස නිළධාරින් 34 ක් එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා අනුයුක්ත කරන ලදි.

සංඛ්‍යා සටහන 10:01 එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා නිළධාරි නියුක්තිය.

| අ/අ | එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් | මාණ්ඩලික නිළධාරින් | නිරීක්‍ෂකයින් |
|---|---|---|---|
| 1 | හයිටි (මිනුස්තා) | 2 | - |
| 2 | මධ්‍යම අප්‍රිකානු ජනරජය(මුනුස්කා) | 4 | - |
| 3 | දකුණු සුඩානය (උන්මිස්) | 5 | - |
| 4 | අබෙයි (යුනිස්ෆා) | 2 | 5 |
| 5 | ලෙබනන් (යුනිෆිල්) | 1 | - |
| 6 | බටහිර සහරා (මිනුර්සෝ) | - | 3 |
| 7 | කොංගෝ (මොනුස්කෝ) | - | 4 |
| 8 | දකුණු සුඩානය (උන්මිස්) | - | 2 |
| 9 | මධ්‍යම අප්‍රිකානු ජනරජයේ නිරීක්‍ෂකයන් (මුනුස්කා) | - | 6 |
| | **එකතුව** | **14** | **20** |

18. 2015 වර්ෂයේ මැද භාගය වන විට හයිටි සාම සාධක මෙහෙයුම් නවතා දමන ලදි 2015 වර්ෂය තුළදි හයිටි ඇතුළු සාම සාධක මෙහෙයුම් වලින් ලද ආදායම පහත පරිදි වේ.

සංඛ්‍යා සටහන 10:2 2015 වර්ෂයේදි එක්සත් ජාතික සාම සාධක මෙහෙයුම් වෙනුවෙන් ලද ආදායම්.

| අ/අ | විස්තරය | හයිටි (රු:) | ලෙබනන් (රු:) | දකුණු සුඩානය (රු:) | එකතුව (රු:) |
|---|---|---|---|---|---|
| 1 | රෛදිපිළි සහ අනෙකුත් දීමනා | 72,691,277.64 | 14,675,856.00 | 5,219,343.45 | 92,586,477.09 |
| 2 | හඨපිරිස් වලට අයත් උපකරණ සඳහා ගෙවන ලද දීමනා | 342,495,063.48 | 56,422,529.99 | - | 398,917,593.47 |
| | **එකතුව** | **415,186,341.12** | **56,422,529.99** | **5,219,343.45** | **491,504,070.56** |




එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම්
- ලෙබනන්



එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම්
- හයිටි





දකුණු සුඩාන් දෙවන අදියර - රෝහල

**<u>පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

19. පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිපත්ති නගා සිටුවීම, යුද්ධ හමුදාධිපති තුමාගේ උපදෙස් නගා සිටුවීම හා සියළුම හමුදාමය සහ හමුදාමය නොවන පුහුණු පාඨමාලා සම්බන්ධීකරණය පිළිබඳව වගකියනු ලැබේ.

**<u>ප්‍රධාන ක්‍රියාකාරකම්</u>**

20. **<u>පුහුණු පාඨමාලා.</u>** දේශිය පුහුණු පාඨමාලා සඳහා සාමාජිකයින් 9,854 දෙනෙකු සහභාගී විය. ආධුනික පුහුණු පාඨමාලා සඳහා ආධුනික පුහුණු සම්බන්ධීකරණ අංශයක් ස්ථාපිත කිරීමේන් එම පාඨමාලා නව්‍යකරණය කරන ලදි. තෝරාගත් යුද්ධ හමුදා ආධුනික පුහුණු පාසැල් 04 ක් හා යුද්ධ හමුදා පුහුණු පාසැල් 06 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පිලිවෙළින් රුපියල් මිලියන 97.9 හා මිලියන 73.9 ක මුදලක් වෙන් කරන ලදි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා භට පිරිස් විදේශයන්හි භට පිරිස් සමග පවත්වන ලද බහු ජාතික ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාස පාඨමාලා 04 ක් සඳහා සහභාගී කරවිය.




'මිත්‍ර ශක්ති' අභ්‍යාසය



'සිල්ක් රූට්' අභ්‍යාසය

21. නිළධාරින් 1,056 ක් හා සෙසු නිළයන් 2,585 දෙනෙකු සිවිල් පුහුණු ආයතන වලින් මෙහෙයවනු ලබන හමුදාමය නොවන පාඨමාලා හැදෑරිම සඳහා අවස්ථාව හිමි කරගන්නා ලදි. නිළධාරින් 387 ක් හා සෙසු නිළයින් 65 ක් කීර්තිමත් ආයතන වලින් මෙහෙය වන ලද විවිධ සම්මන්ත්‍රණ වැඩ මුළු සහ සම්මේලන සහභාගී විමට අවස්ථාව හිමි කර ගන්නා ලදි. රාජ්‍ය ආයතන 20 ක හා පෞද්ගලික ආයතන 14 ක සේවකයින් සඳහා භාහිර පුහුණු පාඨමාලා මෙහෙයවන ලදි. නිළධාරින් 924 ක් හා සෙසුනිළයින් 462 ක් විදේශ පාඨමාලා, සංචාර සහ අභ්‍යාස සඳහා සහභාගී විමට අවස්ථාව හිමි කර ගන්නා ලදි. විදේශ යුද්ධ හමුදා දූත පිරිස් 5 කගේ ශ්‍රි ලංකා සංචාර සම්බන්ධිකරණ කටයුතු මෙම වර්ෂයේදි සිදුකරන ලදි. මීට අමතරව වාර්ෂිකව පවත්වනු ලබන නිළධාරි නිළ උසස් කිරිමේ විභාග මෙහෙය වන ලදි. මෙම වර්ෂය තුළදි නිළධාරින් 970 ක් සහ සෙසු නිලයින් 2,215 ක් දේශිය පාඨමාලා හැදෑරීම සඳහා අවස්ථාව හිමි කරගන්නා ලදි.

ප්‍රස්ථාරය 10:1 2015 වර්ෂයේදි පුහුණු පාඨමාලා සාරාංශය.




**<u>සැළසුම් අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

22. යුද්ධ හමුදාවේ කාර්‍යක්ෂමතාවය සඳහා අවශ්‍ය උපකරණ සපයාදීම සහ යුද්ධ හමුදාධිපතිට සහය ලබාදීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

23. සැළසුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ හසුරුවනු ලබන වැය ශිර්ෂය වනුයේ 2015 වර්ෂයේදි වෙන් කරන ලද මුදල් විස්තරය පහත දැක්වේ .

අ. මුලධන වැය ශිර්ෂ - රු: 97.5 මිලියන.
ආ. පුනරාවර්ථන වැය ශීර්ෂ - රු: 258.8 මිලියන

**<u>මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

24. මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම වනුයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ මනෝවිද්‍යා මෙහෙයුම් සිදුකර ගෙන යාම සහ සැළසුම් කිරිමයි.

**<u>වාර්ෂික කාර්ය සාධනය</u>**

25. 2015 වර්ෂයේදි මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යුද්ධ හමුදා භටපිරිස් වල මානසික තත්ත්වය ඉතා උසස් මට්ටමකට ගෙනඒමට ක්‍රියාමාර්ග ගනු ලැබිය. නිළධාරින්ගේ සහ සොල්දාදුවන්ගේ මානසික තත්ත්වය ධනාත්මක චින්තනයෙන් පෝෂණය කිරිමට ගත් උත්සහය විශාල අභියෝගයක් විය. මේ සඳහා වෙනත් ආයතනවල සහයෝගයද ඇතිව මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ ප්‍රායෝගික හා කාලීන ක්‍රම අත්හදා බැලීම, ප්‍රශ්චාත් යුධ මානසික ආතතියට ගොදුරු වු නිළධාරින්ගේ හා සෙබලුන්ගේ මානසික තත්ත්වය පිළබඳ අවබෝධයක් තිබු හෙයින් ක්ෂේත්‍ර අණදෙන නිළධාරින්ගේද පැසසුමට ලක් විය.

**<u>මාණ්ඩලික රාජකාරි අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

26. යුද්ධ හමුදා සංයුතිය නඩත්තු කිරිම සහ අධීක්ෂණය කිරිම මෙන්ම ඉදුරාම බඳවා ගන්නා ලද නිළධාරින්, කෙඩෙට් නිළධාරින් සහ සෙසු නිළයින් බඳවා ගැනිම සබැඳිව අනුමැතිය ලබාගැනිම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**<u>2015 වර්ෂයේදි ලගා කරගත් ඉලක්ක</u>**

27. අභිනවයෙන් ස්ථාපිත සංස්ථා:

අ. යුද්ධ හමුදා තූර්ය වාදක හා රංග කලා අධ්‍යක්ෂ මණ්ඩලය.
ආ. නිවාරණ හා මානසික සෞඛ්‍ය පිලිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය.
ඇ. වෛද්‍ය උපර්ජන අධ්‍යක්ෂ මණ්ඩලය.
ඈ. 14 වන ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව 14 වන ස්වාධීන ඉංජිනේරු රෙජිමේන්තුව බවට පරිවර්තනය කිරිම.
ඉ. 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා පොලිස් සේවා බළකාය.
ඊ. 12 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය.
උ. 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා වෛද්‍ය බළකාය.

28. පිරිස් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය හා සම්බන්ධව සංස්ථා නගා සිටුවිම, ප්‍රතිෂ්ඨාපනය කිරිම හා බලරහිත කිරිම හා සම්බන්ධ 18 වන යුද්ධ හමුදා චර්යා නියෝගය ප්‍රකාශයට පත්කරන ලදි.

29. නිළධාරින් 596 ක් බඳවා ගැනිම සඳහා පහසුකම් සපයන ලදිඃ

| | | | |
|---|---|---|---|
| අ. | කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | - | 156 (නිත්‍ය) |
| ආ. | ඉදුරාම බඳවා ගැනීම | - | 243 (නිත්‍ය - 164, ස්වේච්ඡා - 79) |
| ඇ. | යුද්ධ හමුදා විද්‍යාපීඨය | - | <u>197</u> (නිත්‍ය - 127, ස්වේච්ඡා - 70) |
| | **එකතුව** | - | **596** |

30. මෙම වර්ෂය තුළදි සෙසු නිළයින් 10,014 බඳවා ගැනිමට පහසුකම් සළසා දෙන ලදි.

31. 2015 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සිවිල් සේවක සංයුතිය:

සංඛ්‍යා සටහන 10:3 සිවිල් සේවක සංයුතිය.

| අ/අ | වෘත්තිය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | වෙනස |
|---|---|---|---|---|
| 1 | අරක්කැමි | 3359 | 2895 | (-) 464 |
| 2 | භෝජනාගාර සේවක | 2437 | 3153 | (+) 716 |
| 3 | 111 ශ්‍රේණිය කම්කරු | 2491 | 2526 | (+) 35 |
| 4 | සනීපාරක්ෂක කම්කරු | 1595 | 1789 | (+) 194 |
| 5 | වෙනත් | 1256 | 617 | (-) 639 |
| | **එකතුව** | **11138** | **10980** | **(-) 158 පුරප්පාඩු** |

<u>**ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය**</u>

32. ප්‍රධාන මාණ්ඩලික ශාඛාව යටතේ මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාත්මක වන අතර මෙහි ප්‍රධාන මුලසුන හොබවන්නේ බ්‍රිගේඩියර් නිළය දරණ ජනමාධ්‍ය අධ්‍යක්ෂ විසිනි. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය සම්බන්ධ සියලු කටයුතු, යුද්ධ හමුදාව හා සම්බන්ධ ක්‍රියාකාරකම් සැබැඳි ලිපි යුද්ධ හමුදා වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කිරිම, යුද්ධ හමුදාව හා සම්බන්ධ චිත්‍රපටි, පින්තූර ඇල්බම් සහ විද්‍යුත් ඇල්බම් නිර්මාණය, යුද්ධ හමුදා උත්සවවලදි ඡායාරූප ගැනිම සහ පටිගත කිරිම, යුද්ධ හමුදා උත්සව පිලිබඳ යුද්ධ හමුදා කෙටි පණිවිඩ සේවය මගින් දැනුවත් කිරිම, යුද්ධ හමුදා උත්සව සඳහා නිවේදක නිවේදිකාවන් සම්පාදනය කිරිම, ජනමාධ්‍ය හා සම්බන්ධ පුහුණු වැඩ සටහන් හා දේශණ මෙහෙයවිම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් කාර්යයන් වේ.

<u>**තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය**</u>


33. අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික සහ ප්‍රධාන සංඥා නිළධාරි වෙත තොරතුරු තාක්‍ෂණ ක්ෂේත්‍රයේ නියෝග, පාලනය සහ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

34. තොරතුරු තාක්‍ෂණය සම්බන්ධ ව්‍යාපෘති 05 ක් මෙම වසර තුළදි ආරම්භ කෙරුණු අතර ඒවායේ කටයුතු තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්ෂ විසින් අධීක්‍ෂණය කරයි. මෙයට යුද්ධ හමුදා රෝහලේ භාවිත වන රෝගීන්ගේ තොරතුරු කළමනාකරණ පද්ධතිය හා දෛනික ලිපි හුවමාරු කිරිමේ පද්ධතියද ඇතුළත් වේ.


35. යුද්ධ හමුදා ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතිය ඇතුලුව ප්‍රධාන ව්‍යාපෘති 05 ක් ස්ථාපනය සඳහා අවශ්‍ය මුලික වැඩකටයුතු සම්පුර්ණ කරන ලද අතර ඒ සඳහා අවශ්‍ය සම්පත් වෙන් කරන ලදි:

අ. දෛනික ලිපි හුවමාරු කිරිමේ පද්ධතිය.
ආ. වත්කම් කළමනාකරණ පද්ධතිය.
ඇ. රෝගීන්ගේ තොරතුරු කළමනාකරණ පද්ධතිය.
ඈ. ශාරිරික යෝග්‍යතා පරීක්‍ෂණ අධීක්‍ෂණය කිරිමේ පද්ධතිය.
ඉ. අභිමංසල සඳහා පිරිස් පරිපාලන පද්ධතිය.

36. පුහුණු සංස්ථා 05 ක් සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීමෙන් හා නව පුද්ගලික ජාල පහසුකම් ලබාදීමෙන් යුද්ධ හමුදා දත්ත ව්‍යාප්ත කිරීමේ III වන අදියර ආරම්භ කරන ලදි.




දෛනික ලිපි හුවමාරු කිරීමේ පද්ධතිය





වත්කම් කළමනාකරණ පද්ධතිය




රෝගීන්ගේ තොරතුරු කළමනාකරණ පද්ධතිය




ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ අධීක්ෂණය කිරීමේ පද්ධතිය




අභිමංසල සඳහා පිරිස් පරිපාලන පද්ධතිය

**ඉංජිනේරු බලසේනාව**

37. රු: 310,566,598.35 වටිනාකමකින් යුත් ඉංජිනේරු හා ඉදිකිරීම් කටයුතු රාශියක් මෙම වර්ෂය තුළදී සිදු කරන ලදි තවද රු 214,304,147.07 වටිනාකමකින් යුත් යුද්ධ හමුදා ව්‍යාපෘති මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවති. සිවිල් ආයතන මගින් ලබා දෙනු ලැබූ රු: 329,179.95 වටිනාකමකින් යුත් ව්‍යාපෘති ඉතා නුදුරේදී සම්පුර්ණ කිරිමට අවකාශය ලැබෙනු ඇත. ඉංජිනේරු ව්‍යාපෘති 18 ක භාරකාරත්වය ලබාගන්නා ලදි.

38. ඉංජිනේරු ව්‍යාපෘති යටතේ නුවරඑළිය, පරන්තන් හා බේරුවල යන ප්‍රදේශ වල පාලම් 03 ක් ඉදිකරන ලදි. තවද මුණමල්වත්ත පාලම ප්‍රතිසංස්කරණය කරන ලද අතර බේරුවල කඩොලානදුව ප්‍රදේශයේහි විශාල ගල් පර්වතයක් පිපිරවිම සිදු කරන ලද අතරම කැළණිය ප්‍රදේශයේ පදිකයන් සඳහා පාලමක් ඉදිකරන ලදි.





නුවරඑළිය පාලම






කැළණියෙහි ඉදිකරන ලද පදිකයන් සඳහා වු පාලම

## මූල්‍ය කළමනාකරණ ශාඛාව

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය කළමනාකරණයට අදාල පුරෝකථනය, සැලසුම්කරණය, පාලනය සහ සමාලෝචනය සම්බන්ධව ගණන්දීමේ නිළධාරි වන යුද්ධ හමුදාධිපතිට සහ ප්‍රධාන ගණන් දීමේ නිළධාරි වන ආරක්ෂක ලේකම් හට අධ්‍යක්ෂ ජෙනරාල් මුල්‍ය කළමණාකරන වගකිව යුතු වේ. එසේම මුල්‍ය කළමණාකරණ ශාඛාව යටතේ පවතින සියළුම අධ්‍යක්ෂ මණ්ඩලයන්හි නිසි කළමනාකරණය, සුපරීක්ෂාව, නායකත්වය ලබා දිම සහ කාර්‍යභාරයන් සම්බන්ධිකරණය කිරිම සම්බන්ධව වගකිමද අධ්‍යක්ෂ ජෙනරාල් මුල්‍ය කළමණාකරන සතු වේ.

රූප සටහන 11:1 මූල්‍ය කළමනාකරණ ශාඛාව යටතේ ඇති සංස්ථා.




### <u>අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය</u>

2. අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය මුල්‍ය කළමනාකරණ ශාඛාව යටතේ පාලනය වන අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මුල්‍ය කළමනාකරණය, අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරිම හා වැය ශීර්ෂ වෙන්කිරිම, මුල්‍ය කළමනාකරණ තොරතුරු අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන්ට අවශ්‍යතාවය අනුව සැපයිම යන කාර්යයන් කාර්‍යක්ෂමව හා ඵලදායි ලෙස සිදු කිරිම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකිම වේ.

3. **<u>පුනරාවර්තන වියදම්.</u>** 2015 වසරේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පුනරාවර්තන වියදම් ලෙස රුඃ මිලියන 140,805.26 ක් ඇස්තමේන්තු ගත කර තිබූ අතර මහා භාණ්ඩාගාරයෙන් රුඃ මිලියන 132,179.50 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබාදි ඇත. මෙම මුදලින් රුඃ මිලියන 98,480.00 මුදලක් වැටුප් ගෙවිම සඳහා වෙන් කරන ලද අතර ඉතිරි මුදල් වෙනත් පුනරාවර්තන වියදම් සඳහා වෙන් කරන ලදි.

4. **<u>මුලධන වියදම්.</u>** 2015 වර්ෂය සඳහා රුඃ මිලියන 13,475.37 ක මුදලක් ඇස්තමේන්තු ගත කර තිබුනද මහා භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලද්දේ රුඃ මිලියන 7,384.63 ක මුදලක් පමණි.

5. **ක්‍රියාකාරකම් විශ්ලේෂණය හා ඇගයීම.** 2015.12.31 දිනට වැය ශිර්ෂ වාර්තාව පහත පරිදි වේ:

අ. **පුනරාවර්තන වියදම්.**

සංඛ්‍යා සටහන 11:1 2015 වර්ෂය සඳහා වෙන්කරන ලද පුනරාවර්තන වියදම්.

| අ/අ | වැය ශිර්ෂ විස්තරය | 2015.12.31 දිනට මුලු ප්‍රතිපාදන ප්‍රමාණය (රු:) | 2015.12.31 දිනට සත්‍ය වියදම (රු:) |
|---|---|---|---|
| 1 | පුද්ගල වැටුප් | 117,006,200,000.00 | 117,003,050,317.75 |
| 2 | ගමන් වියදම් | 253,020,000.00 | 252,744,642.09 |
| 3 | වෙනත් සැපයීම් | 27,250,419,000.00 | 27,250,320,639.00 |
| 4 | නඩත්තු වියදම් | 612,331,000.00 | 611,785,510.00 |
| 5 | වෙනත් සේවා | 5,957,700,000.00 | 5,956,919,147.00 |
| 6 | මාරු කිරීම් | 549,800,000.00 | 549,746,441.00 |
| | **මුළු එකතුව** | **151,629,470,000.00** | **151,624,566,696.84** |

ආ. **මූලධන වියදම්.**


සංඛ්‍යා සටහන 11:2 2015 වර්ෂය සඳහා වෙන්කරන ලද මූලධන වියදම්.

| අ/අ | වැය ශිර්ෂ විස්තරය | 2015.12.31 දිනට මුලු ප්‍රතිපාදන ප්‍රමාණය (රු:) | 2015.12.31 දිනට සත්‍ය වියදම (රු:) |
|---|---|---|---|
| 1 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරිම | 536,800,000.00 | 532,697,747.87 |
| 2 | මූලධන වත්කම් අත්පත් කරගැනිම | 2,468,644,800.00 | 2,447,263,289.32 |
| 3 | මානව සම්පත් සංවර්ධනය | 995,825,200.00 | 995,331,941.52 |
| **වෙනත් මූලධන වියදම්** | | | |
| 4 | වෙනත් ආයෝජන | 1,880,160,000.00 | 1,880,159,758.89 |
| | එකතුව | 5,881,430,000.00 | 5,855,452,737.60 |
| | ණය යෝජනා ක්‍රම | 2,304,000,000.00 | 759,860,342.27 |
| **මුලු එකතුව** | | **8,185,430,000.00** | **6,615,313,079.87** |


නව පිටුවක් සඳහා හිස්තැනකි

ප්‍රස්ථාරය 11:1  2015 වර්ෂය සඳහා වෙන්කරන ලද පුනරාවර්තන සහ මුලධන වියදම්.

## ප්‍රතිපාදන වෙන්කිරිම




## සත්‍ය වියදම



6. 2015 වර්ෂය තුළදි ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හයිටි ලෙබනන් හා සුඩාන් වල එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරි වල නියුතු වූ හථපිරිස් සඳහා අවශ්‍ය භාණ්ඩ සහ උපකරණ මිළදි ගැනිම සඳහා රුː මිලියන 271.61 ක මුදලක් යොදවා ඇති අතර එම මෙහෙයුම් තුළින් රුː මිලියන 491.47 ක මුදලක් උපයා තිබේ.

7. වාර්ෂික ඇස්තමේන්තුගත කිරිම් වලට අමතරව මහා භාණ්ඩාගාරය විසින් අතිරේක පුනරාවර්තන හා මුලධන වියදම් සඳහා වෙන්කරන ලද මුදල් විස්තරය පහත පරිදි වේ:

අ. **<u>අතිරේක පුනරාවර්තන වියදම්.</u>**

සංඛ්‍යා සටහන 11:3 2015 වර්ෂය සඳහා වෙන්කරන ලද අතිරේක පුනරාවර්තන වියදම්.

| අ/අ | විස්තරය | වටිනාකම (රුː මිලියන) |
|---|---|---|
| 1 | පුද්ගල වැටුප් | 18,226,200,000.00 |
| 2 | ගමන් වියදම් | 24,000,000.00 |
| 3 | වෙනත් සැපයීම් | 1,000,570,000.00 |
| 4 | නඩත්තු වියදම් | 50,000,000.00 |
| 5 | වෙනත් සේවා | 450,000,000.00 |
| 6 | මාරු කිරිම් | 70,000,000.00 |
| | **මුළු එකතුව** | **19,820,770,000.00** |

ආ. **<u>අතිරේක මුලධන වියදම්.</u>**

සංඛ්‍යා සටහන 11:3 2015 වර්ෂය සඳහා වෙන්කරන ලද අතිරේක මුලධන වියදම්.

| අ/අ | වැය ශිර්ෂ විස්තරය | මුදල රුː මිලියන |
|---|---|---|
| 1 | මුලධන වත්කම් පුනරුත්ථාපනය හා සංවර්ධනය | 30,000,000.00 |
| 2 | මුලධන වත්කම් අත්පත් කර ගැනිම | 265,000,000.00 |
| 3 | වෙනත් ආයෝජන | 135,000,000.00 |
| | **එකතුව** | **430,000,000.00** |

**<u>අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

8. මුල්‍ය කටයුතු වලට අදාලව පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්ය සාධනය අධීක්ෂණය, ඇගයීම සහ කාලීනව වෙනස් වන මුලික රෙගුලාසි වලට අනුකුලව පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කිරිම.

අ. අඛණ්ඩ සමීක්ෂණ සිදුකිරිම තුළින් පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරිම.

ආ. වත්කම් අලාභ, නාස්තිය හා යල් පැනීම් වලින් සුරක්ෂිත කිරිම.

ඇ. දුර්වල පද්ධති හඳුනාගෙන එම පද්ධති වැඩිදියුණු කිරිම.

ඈ. වැරදි හා වංචා වැළැක්වීම සහ හෙළිදරව් කරගැනිම සඳහා අවශ්‍ය වන අභ්‍යන්තර පාලන ක්‍රියාත්මක කිරිම.

<u>වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය</u>

9. වැටුප්, දීමනා, වන්දි ගෙවීම හා සම්බන්ධ ප්‍රතිපත්ති නගා සිටුවීම, පුද්ගලික ලිපි ලේඛණ නඩත්තු කිරිම, වාර්ෂික පරිපූරක ඇස්තමේන්තු සැකසීම, ස්ථායි පිරිස් බලයක් නඩත්තු කිරිම වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

10. 2015 වසරේ දුබලතා වැටුප් හා පාරිතෝෂික දීමනා ගෙවීම් පහත පරිදි වේ:

සංඛ්‍යා සටහන 11:5 දුබලතා වැටුප් හා පාරිතෝෂික දීමනා ගෙවීම.

| අ/අ | විස්තරය | හිමිගැන්වූ පුද්ගලයින් සංඛ්‍යාව | මුදල (රුඃ මිලියන) |
|---|---|---|---|
| 1 | පරිවර්තිත පාරිතෝෂික | 4451 | 3,115.70 |
| 2 | සේවා පාරිතෝෂික | 243 | 86.68 |
| 3 | දුබලතා විශ්‍රාම වැටුප් | 881 | 462.14 |
| | **එකතුව** | **5575** | **3,664.52** |

11. යුද්ධ හමුදා යහසාධක අරමුදල යටතේ ලබා දෙනු ලබන ණය පිළිබඳ විස්තරය.

සංඛ්‍යා සටහන 11:6 යුද්ධ හමුදා යහසාධක අරමුදල යටතේ ලබා දෙනු ලැබූ ණය.

| අ/අ | විස්තරය | හිමිගැන්වූ පුද්ගලයින් සංඛ්‍යාව | මුදල (රුඃ මිලියන) |
|---|---|---|---|
| 1 | පුද්ගලික ණය | 5539 | 4,232.4 |
| 2 | ණය බරින් නිදහස් වීමේ ණය | 2718 | 2,010.1 |
| | **එකතුව** | **8257** | **6,242.5** |

12. 2015 වසර තුළ සෙසුනිළ සේවය දීර්ඝ කිරිම් හා නැවත බඳවා ගැනිම්.

සංඛ්‍යා සටහන 11:7 2015 වසර තුළ සෙසුනිළ සේවය දීර්ඝ කිරිම් හා නැවත බඳවා ගැනිම්.

| අ/අ | විස්තරය | පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සේවය දීර්ඝ කිරිම | 11126 |
| 2 | නැවත බඳවා ගැනීම | 3942 |
| | **එකතුව** | **15068** |

13. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් හා ප්‍රගතිය.</u>** අවශ්‍ය අවස්ථාවන්හිදී මාසික වැටුප් හා දීමනා ණය, විදේශ පුහුණු දීමනා පිළිබඳ වාර්ෂික ඇස්තමේන්තු හා අතිරේක ඇස්තමේන්තු වාර්තා සකස් කිරිම වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරනු ලබයි.

14. 2015.12.31 දින වන විට වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වැටුප් හිමි ගන්වනු ලබන මියගිය/ ආබාධිතව අස්ව ගිය අයවලුන්ගේ සංඛ්‍යාව 32,358 කි මියගිය අයවලුන්ගේ යැපෙන්නන් හට කරනු ලබන දීමනාව මාසිකව වෙනස් වේ. යැපෙන්නන් හට මාසික වැටුප් හා දීමනා හිමිගැන්වීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරනු ලබන අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් හා යැපෙන්නන්ගේ දීමනා ගෙවීම සඳහා ඇවැසි ලියකියවිලි වැටුප් හා ලේඛණ ඒකක විසින් යොමු කල පසු අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකරනු ලබයි.

15. **මුල්‍ය තත්ත්වය.** 2015 දෙසැම්බර් මස මුල්‍ය වාර්තාව අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වැටුප් ගෙවු සංඛ්‍යාව 181,961 ක් වේ (ක්‍රියාන්විතයේදි අබාධිත වු හා අස්කල අය හැර). රජයේ නිළධාරින්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ යුද්ධ හමුදා සාමාජිකයන් වෙත කඩිනමින් ආපදා ණය ගෙවීම සඳහා යුද්ධ හමුදා යහ සාධක අරමුදලේ පවතින නිළධාරි/සෙසුනිල තැන්පතු මගින් මුදල් ලබා ගෙන ආපදා ණය හා දේපල ණය හිමි ගැන්වීමටත් ණය ලාභියාගෙන් අයකරනු ලබන පොලී අනුපාතය හා වෙළඳපොළ පොලී අනුපාතය අතර වෙනස රජය මගින් දැරීමටත් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ එකගතාව ලබා දෙන ලදි. ඒ අනුව 2015.12.31 වන දින දක්වා ලියාපදිංචි ණය අයදුම්පත් 12,297 ක් සඳහා ගෙවීම් කර තිබේ. 2015 වර්ෂය වෙනුවෙන් විදේශීය පාඨමාලා / සංචාර සඳහා රුඃ මිලියන 927.9 මුදල් වෙන් කර ඇත. තවද වැටුප් හා ලේඛණ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් හසුරුවන ලද රුඃ මිලියන 698,018,348.80 වැය ශිර්ෂ පහත පරිදි වේ:

අ. **යුද්ධ හමුදා වැය ශිර්ෂ.**

සංඛ්‍යා සටහන 11:8 යුද්ධ හමුදා වැය ශිර්ෂ.

| අ/අ | විස්තරය | රුඃ මිලියන |
|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 112,042.06 |
| 2 | විදේශ පාඨමාලා/සංචාර දීමනා | 927.95 |
| 3 | දේපළ ණය පොලිය | 223.61 |
| 4 | වන්දි | 232.81 |
| 5 | සංයුක්ත දීමනා | 0.10 |
| 6 | සලාක | 734.27 |
| 7 | අභ්‍යාස දීමනා | 29.92 |
| 8 | වෙනත් | 21,971.09 |
| 9 | රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | 2,227.40 |
|  | **එකතුව** | **138,389.21** |

අ. **වෙනත් වැය ශිර්ෂ.**

සංඛ්‍යා සටහන 11:9 **වෙනත් වැය ශිර්ෂ.**

| අ/අ | විස්තරය | රුඃ මිලියන |
|---|---|---|
| 1 | මියගිය සහ ආබාධිතව අස්කල (වැය ශිර්ෂය - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව) | 20,530.57 |
| 2 | රණවිරු දෙමාපියන් වෙත ( වැය ශිර්ෂය - ආරක්‍ෂක අමාත්‍යාංශය) | 1,334.23 |
| 3 | පාරිතෝෂික (වැය ශිර්ෂය - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව) | 697,858,094.79 |
|  | **එකතුව** | **697,879,959.59** |

## වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය

16. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත මහජන අරමුදලින් මිළදී ගෙන ඇති වත්කම් පවත්වා ගෙන යාම සඳහා උපදෙස් ලබාදීම සහ මුදල් රෙගුලාසි අනුව ක්‍රියාකිරීම මගින් යුද්ධ හමුදා වත්කම් ආර්ථික පිරිමැසුම්දායකව, කාර්‍යක්ෂමව හා සඵලදායී ලෙස කළමනාකරණය කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

17. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් හා ප්‍රගතිය.</u>** වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් ප්‍රධාන අංශයන් හතර යටතේ ක්‍රියාත්මක වේ:

අ. සමීක්ෂණ මණ්ඩල අංශය.
ආ. ස්ථාවර වත්කම් අංශය.
ඇ. නැතිවීම් හා අලාභහානි වීම් අංශය.
ඈ. ප්‍රසම්පාදන අංශය.

18. දෙවන අඩවසර සඳහා වෙන්දේසිය 2015.12.07 වන දින සිට 2015.12.18 වන දින දක්වා පවත්වන ලද අතර එහි දළ ආදායම රු: 91,383,085.50 කි.

19. **<u>අනාගත සැළසුම්.</u>** ස්ථාවර වත්කම් සඳහා දැනට පවත්නා ස්ථාවර වත්කම් මෘදුකාංග පද්ධතිය ජාල ගත පද්ධතියක් ලෙස වැඩිදියුණු කිරීමට නියමිතය. එම නව පද්ධතිය මගින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සතු ස්ථාවර වත්කම් වඩාත් කාර්යක්ෂමව, සඵලදායීව හා පිරිමැසුම්දායක ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව ලැබෙන අතර ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා වඩාත් පහසුවෙන් හා නිවැරදිව ලබාගැනීමේ හැකියාවක් පවතින අතර මෙම පද්ධතිය 2016 වර්ෂයේ ජනවාරි සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය.

## කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය

20. ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකාර්මික ව්‍යාපෘතීන්ගේ කළමණාකාරීත්වය හා කාර්යක්ෂමතාවය උසස් කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම වැනි කරුණු මූලික කර ගනිමින් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාපිත කරන ලදි. දැනට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යටතේ ගොවිපලවල් 06 ක් ක්‍රියාත්මක වේ. එම ගොවිපලවල් කිරි ආහාර නිෂ්පාදනය සහ එළවලු සහ පළතුරු නිෂ්පාදනයේ නියලේ.

අ. කන්දකාඩු ගොවිපල.
ආ. මැණික් ගොවිපල.
ඇ. නච්චිකුඩා ගොවිපල.
ඈ. වේල්ලම්කුලම් ගොවිපල.
ඉ. උදයාර්කට්ටුකුලම් ගොවිපල .
ඊ. යාල පලටුපාන ගොවිපල.



කිරි ගොවිපල - කන්දකාඩු



එළවලු වගාව - මැණික් ගොවිපල

**<u>මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

21. මහජන මුදල් පාලනයේ ප්‍රධාන කාර්යභාර්ය (රාජ්‍ය අයවැයෙන් මහා භාණ්ඩාගාරය වෙත ලබා දෙන ද්‍රවශීල මුදල් කළමනාකරණය සහ පාලනය කිරිම) මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු විසින් සිදු කරනු ලබයි. රජයේ මුල්‍ය රෙගුලාසි වලට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාල මහජන මුදල් ගිණුම්ගත කිරිම සහ අනෙකුත් මුල්‍ය ක්‍රියාකාරකම් සිදුකිරිම මුදල් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්‍යභාර්ය වන අතර මහා භාණ්ඩාගාරය විසින් ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශය සහ අදාල චක්‍රලේඛ නිකුත් කිරිම සිදුකරනු ලබයි.

22. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් හා ප්‍රගතිය.</u>** 2015 වර්ෂයේදි පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා රජය මගින් රුː159,814,900,000.00 ක මුදලක් වෙන් කර දී ඇත. එම වසර තුළ සම්පාදනය කරන ලද සත්‍ය පුනරාවර්තන වියදම රුː 151,629,470,000.00 වන අතර මූලධන වියදම 8,185,430,000.00 කි.

**<u>යුද්ධ හමුදා යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

23. **<u>අරමුදල හා සාමාජිකත්වය.</u>** 2015 වර්ෂය තුලදි යුද්ධ හමුදා සාමාජිකයින් 13469 දෙනෙකුට අරමුදලේ සාමාජිකත්වය ලබාදි ඇති අතර වර්ෂය අවසානයේදි සම්පූර්ණ සාමාජිකයින් සංඛ්‍යාව 171,400 ක් විය. වර්ෂය තුළදි අරමුදල රුː බිලියන 4.5 කින් වර්ධනය වි ඇති අතර වර්ෂය අවසානයේදි අරමුදලේ සම්පූර්ණ වටිනාකම රුː බිලියන 55.18 ක් වේ.


24. **<u>ආයෝජන.</u>** 2015.12.31 වන දිනට මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුවසහන ණය යෝජනා ක්‍රමය යටතේ යුද්ධ හමුදා සාමාජිකයින් 24718 දෙදෙනෙකු වෙනුවෙන් රුː මිලියන 18029.00 ක මුදලක්ද ආපදා ණය යෝජනා ක්‍රමය යටතේ යුද්ධ හමුදා සාමාජිකයින් 13870 වෙනුවෙන් රුː මිලියන 2250.27 මුදලක් ලබාදි ඇත.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## විධායක ජෙනරල් ශාඛාව

1. ප්‍රධාන මාණ්ඩලික නිළධාරි තනතුරු හොබවන ලබන මේජර් ජෙනරල් නිලයේ ජ්‍යෙෂ්ඨ නිළධාරින් අතරින් අයකු වන යුද්ධ හමුදා මූලස්ථානයේ විධායක ජෙනරල් ශාඛාවේ ආයතන ප්‍රධානී වන විධායක ජෙනරල් විසින් සියළුම පරිපාලනමය විෂය පථයට අදාල කරුණු සැබැඳිව යුද්ධ හමුදාධිපති වෙත වගකිව යුතු වේ. විධායක ජෙනරල් ශාඛාව විසින් විනය නියමයන් හා සේවා කොන්දේසි හා උත්සව වෙනුවෙන් යුද්ධ හමුදා නීතියට යටත්ව වගකීම් දරණු ලබයි:

රූප සටහන 12:1 විධායක ජෙනරල් ශාඛාව යටතේ ඇති සංස්ථා.




### පිරිස් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය

2. සෙසු නිළයින්ගේ බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැනීම දක්වා සියලු පරිපාලන කටයුතු සිදුකරනු ලබන අතර රාජ්‍ය සහ යුද්ධ හමුදා උත්සව සංවිධානය හා මෙහෙයවීම, පිරිස් පරිපාලනය හා සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

### නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය

3. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ සියළුම නීති ගැටළු සම්බන්ධව ක්‍රියාකිරීම සහ ඒ හා සම්බන්ධව යුද්ධ හමුදාධිපතිට උපදෙස් ලබා දීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාර්ය වේ .

4. **ශාක්‍යතා සංවර්ධන ක්‍රියාකාරකම්.** මෙම වර්ෂය තුළදී ජාතික නීති සමුළුව, කාන්තා පිරිමි සාමානාත්මතා පටිපාටි සමුළුව හා ජාතික සංගමයේ නීති සමුළුවට නීති නිළධාරින් සහභාගි විය.

**<u>විනයාරක්ෂක අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

5. යුද්ධ හමුදා පොලිස් රාජකාරි හා සම්බන්ධ නියෝග හා පාලන කටයුතුද විනයාරක්ෂක කටයුතු පිළිබඳවද යුද්ධ හමුදාධිපතිට උපදෙස් ලබාදීමද, යුද්ධ හමුදාව තුළ ඉතා උසස්ව විනය පවත්වා ගෙන යාමද මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. එමෙන්ම විනය ආරක්ෂාව හා බැදුණු සාමාන්‍ය ආයතන ව්‍යුහය තාක්ෂණික තත්වය පුහුණුව හා ඒ හා බැදුණු උපකරණ සම්බන්ධයෙන් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වග කිව යුතු වේ.

**<u>සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

6. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සේවය කරන නිළධාරින්/සෙසු නිළයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සුභසාධන පහසුකම් සැපයීම තුළින් ඔවුන්ගේ ජීවන තත්වය උසස් කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන ඉලක්යයි. මෙම හේතුව මත මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික කාර්යභාර්ය වනුයේ දැනට සිදුකරනු ලබන සුභසාධන ව්‍යාපෘතිවල අඛණ්ඩ ක්‍රියාකාරීත්වය තහවුරු කිරිම සහ යුද්ධ හමුදාධිපතිගේ අනුමැතිය ඇතිව සියළුම නිලයන්ට ප්‍රතිලාභ ලබා ගත හැකි නව සුභසාධන ව්‍යාපෘති දියත් කිරීමයි.

**<u>වාර්ෂික කාර්ය සාධනය</u>**

7. සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන ලද සුභසාධක ව්‍යාපෘති පහත පරිදි වේ:

අ. ණය යෝජනා ක්‍රම.
ආ. ඉඩම් ව්‍යාපෘති.
ඇ. රජයේ පාසැල් සහ ආරක්ෂක සේවා විද්‍යාලය වෙත යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දරුවන් තෝරා ගැනිම.
ඈ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා රක්ෂණාවරණ යෝජනා ක්‍රමය.
ඉ. සුවසහන අරමුදල.
ඊ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නීති ආධාර අරමුදල.
උ. යුද්ධ හමුදා මරණාධාර ප්‍රතිපූර්ණය.
ඌ. ක්‍රියාන්විතයේදි මියගිය හා ආබාධිත වූ සොල්දාදුවන් සඳහා නිවාස ඉදි කරදීමේ ව්‍යාපෘතිය.





ක්‍රියාන්විතයේදි මියගිය හා ආබාධිත වු සොල්දාදුවන් සඳහා නිවාස ඉදිකර දීමේ ව්‍යාපෘතිය

<u>**රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය**</u>

8. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මුල් අවධියේදී අතිරේක සුභසාධන අධ්‍යක්ෂ මණ්ඩලය වශයෙන් ස්ථාපිත කලද පසු කාලීනව එය රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස නැවත ස්ථාපිත කරන ලදි.

9. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාන්විතයේදී මියගිය හා ආබාධිත වු සෙබලුන්ගේ සුභසාධනය වෙනුවෙන් වගකිව යුතු වේ.

<u>**පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය**</u>

10. ක්‍රියාන්විතයේදී ආබාධිත වු නිළධාරින්/සෙසුනිළයන් පුනරුත්ථාපනය කිරිමේ අරමුණින් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාපිත කරන ලදි ක්‍රියාන්විතයේදී ආබාධිත වු රණවිරුවන් සඳහා ඵලදායී සේවයක් ලබාදීමේ අරමුණින් පහත සඳහන් ආයතන ස්ථාපිත කරන ලදි.

- අ. රණවිරු සෙවන.
- ආ. රණවිරු ඇපරල්.
- ඇ. අභිමංසල I.
- ඈ. අභිමංසල II.
- ඉ. අභිමංසල III.
- ඊ. රණවිරු සම්පත් කේන්ද්‍රය.
- උ. මිහිදු සෙත් මැදුර.




අභිමංසල - අනුරාධපුරය



අභිමංසල - පාන්ගොල්ල



අභිමංසල - කඹුරුපිටිය



මිහිදු සෙත් මැදුර - අත්තිඩිය

11. **හැකියා සංවර්ධන ක්‍රියාකාරකම්**. ආබාධිත සොල්දාදුවන්ගේ සුභසාධනය උදෙසා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය හා මරේගෝපදේශකත්වය යටතේ පහත සඳහන් වැඩ සටහන් දියත් කරන ලදි.

අ. භාවනා වැඩසටහන්.

ආ. වාර්ෂික අධ්‍යාපන චාරිකාව.

ඇ. උපදේශණ වැඩසටහන්.

**මානව හිමිකම් හා මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය**

12. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වනුයේ මානව හිමිකම් හා මානුෂවාදී නීතිය උල්ලංඝණය වීම වැළැක්වීම සහ ඒ පිලිබඳව සාමාජිකයින් දැනුවත් කිරිමයි.

13. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ මුලික කාර්යභාර්ය වනුයේ මානව අයිතිවාසිකම් හා මානුෂවාදී නීතිය හා සම්බන්ධ මුලධර්ම හා ගිවිසුම් ජාත්‍යන්තර මානුෂවාදී නීතයට ගැලපෙන ලෙස සකස් කිරීමයි. තවද ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල ඒ හා සම්බන්ධ පුහුණු කටයුතු අධීක්ෂණය පටිගත කිරිම සහ වාර්තා කිරිම යනාදියයි.

**වාර්ෂික කාර්ය සාධනය**

14. මෙම වර්ෂය තුළදි නිළධාරින් 2953 ක් සහ සෙසුනිල 68273 ක් සඳහා පාඨමාලා 04 ක් සහ වැඩමුළු සහ සම්මන්ත්‍රණ 741 ක් මානව හිමිකම් හා මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයවන ලදි.

**ආධුනිකයින් බඳවා ගැනීමේ අධ්‍යක්ෂ මණ්ඩලය**

15. ශ්‍රි ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාවය පරිදි ශ්‍රී ලාංකික පුරවැසියන් නිළධාරින් සහ සෙසු නිලයන් වශයෙන් බඳවා ගැනීම සම්බන්ධයෙන් විධායක ජෙනරාල්වරයා හරහා යුද්ධ හමුදාධිපතිට වගකිව යුතු වේ.

**සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය**


16. ශ්‍රි ලංකා යුද්ධ හමුදාව තුල සේවය කරන සිවිල් සේවකයින්ගේ වඩා කාර්‍යක්‍ෂම හා පලදායී සේවයක් ලබාගැනීමේ අරමුණින් ඔවුන්ගේ සියළුම පරිපාලන කටයුතු සිදුකිරිම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මෙම සිවිල් සේවකයින් අරක්කැමි, භෝජණාගාර සේවකයින්, කම්කරුවන්, සනීපාරක්‍ෂක කම්කරුවන් පෙදරේරුවන් සහ වඩු කාර්මිකයන් ආදී විවිධ ක්ෂේත්‍රවල නියැලේ. ඔවුන් ස්ථිර අනියම් හා යා කිරීම් ආදී වශයෙන් දීප ව්‍යාප්ත යුද්ධ හමුදා කඳවුරුවල උපකාරක සේවයේ නියුතු වේ.

17. සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 11000 කට අධික සිවිල් සේවකයින්ගේ පරිපාලන කටයුතු සිදු කරනු ලබයි. අධ්‍යක්ෂ තුමාගේ පරිපාලන බලය කොළඹ, අනුරාධපුර, මින්නේරිය, කිළිනොච්චි, මුලතිව් හා යාපනය යන ප්‍රාදේශීය කාර්යාල වෙත පවරා ඇත.

## උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව

1. උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන මාණ්ඩලික ශාඛාවන් අතුරින් 01 කි. ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත දුම්රිය, ගොඩබිම මාර්ග, ගුවන් සහ මුහුදු මාර්ග මගින් භට පිරිස් සහ භාණ්ඩ ප්‍රවාහනය මෙම ශාඛාව මගින් පාලනය කරනු ලබයි. යුද්ධ හමුදා ජනපද, භටනිවාස පරිපාලනය, නවාතැන් පහසුකම් ලබාදීම, සලාක සැපයීම, සියළුම ප්‍රවාහන අවශ්‍යතා, යුද්ධ හමුදාවේ සියළුම ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා ක්‍රියාත්මක කිරීම උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව සතු වගකීම් වේ.

රූප සටහන 13:1 උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ ඇති සංස්ථා




2. **<u>මූල්‍ය විස්තරය.</u>** උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ පාලනය වන සියළුම ගිණුම් වල ප්‍රතිපත්ති පාලක උපකරණ මාස්ටර් ජෙනරාල් වේ. රු: 384,708,208.51 මෙම වර්ෂය සඳහා වෙන් කරන ලද අතර සුළු ප්‍රසම්පාදන කමිටු 40 ක් මෙම වර්ෂය තුළදී මෙහෙය වන ලදී.

3. **<u>අභියෝග සහ නිර්දේශයන්</u>.** වාර්ෂික වෙන් කිරීම යටතේ සියළුම සැළසුම් ක්‍රියාත්මක වුවද පෙර වසරේ ඉදිරියට ගෙන ආ ශේෂයට පරිභාහිරව පුනරාවර්තන වැය ශීර්ෂය යටතේ ද්‍රවශීලි මුදල් ලැබී ඇත්තේ 61% ක් හා ප්‍රාග්ධන වැය ශීර්ෂය යටතේ 82% වශයෙනි. ඉහත කරුණු හේතුවෙන් සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ගිවිසුම් වලට අනුකූලව ක්‍රියාත්මක නොවීම කෙරෙහි බලපෑ අතර එය ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා ශාඛාවේ ඉදිරි කටයුතු පසුගාමී වීමට හේතුවක් වී ඇත. සැපයුම් හා කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවනු ලබන ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් ගිවිසුම් කඩකිරීම සැබැඳිව ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම වැළකී ඇත. ප්‍රධාන වෙළඳ සමාගම් යුද්ධ හමුදා ටෙන්ඩරයන් වෙත ලන්සු තැබීම සැළකිව යුතු ලෙස පහත වැටී ඇත. එම නිසා මෙම ශාඛාවේ පවතින අවශ්‍යතාවයන්ට අනුව මූල්‍ය කළමනාකරණ ශාඛාව මගින් වාර්ෂිකව බෙදා වෙන් කරනු ලබන ද්‍රවශීලි මුදල් කාලානුරූපීව වෙන් කිරීම සුදුසු යැයි මින් ගම්‍ය වේ.

### <u>භට නිවාස සම්පාදන අධ්‍යක්ෂ මණ්ඩලය</u>

4. භට නිවාස සම්පාදන අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙනුවෙන් සැළසුම් කිරීම, භට නිවාස වෙන් කර දීම ඉඩම් සහ ගොඩනැගිලි අත්පත් කරගැනීම සහ කුලී පදනම මත ලබාගැනීම සඳහා වගකිව යුතු වේ.

5. භට නිවාස සම්පාදන අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පහත පරිදි වේ:
   - අ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙනුවෙන් ඉඩම් සහ ගොඩනැගිලි මිළදී ගැනීම.
   - ආ. කුලී සහ ගාස්තු බදු ගෙවීම.
   - ඇ. විවාහක නිළ නිවාස වෙන් කර දීම.
   - ඈ. යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා නිවාඩු නිකේතන වෙන්කර දීම.

### <u>ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය</u>

6. ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය සියළුම ප්‍රවාහන අවශ්‍යතා සැළසුම් කර ප්‍රවාහනය කිරීම සහ ඒවා ප්‍රවාහනයේදී ප්‍රතිපත්තීන් අනුව ක්‍රියාත්මක වනවාදැයි සොයාබැලීම අතරමැදි කඳවුරුවල සහ ගමන් පාලන මධ්‍යස්ථාන වල ක්‍රියාකාරීත්වය සහ එහි කාර්මික පාලනය සම්බන්ධයෙන් වගකියනු ලබයි.

**<u>සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

7. සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පහත පරිදි වේ:

අ. කොන්ත්‍රාත් කැඳවීම, තොග රැස්කිරීම, සලාක මිළදී ගැනීම, සලාක නිකුත් කිරීම, ගිණුම් තැබීම, තොග කළමනාකරණය හා ඉන්ධන නිකුත් කිරීම.

ආ. යුද්ධ හමුදා මූලස්ථානයේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි නාවික හමුදාවට සහ ගුවන් හමුදාවට ව්‍යාපෘති සඳහා සහ වෙනත් ආයතන සඳහා සලාක ඉන්ධන නිකුත් කිරීම.

ඇ. යුද්ධ හමුදා මූලස්ථානයේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට නාවික හමුදාවට සහ ගුවන් හමුදාවට ව්‍යාපෘති සඳහා සහ වෙනත් ආයතන සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම.

ඈ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 'බී' කාණ්ඩයට අයත් වාහන නඩත්තු කිරීම.

**<u>ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

8. ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ඉංජිනේරු සේවා වල තාක්ෂණික ගැටළු සම්බන්ධයෙන් යුද්ධ හමුදාධිපතිට උපදෙස් දීමට බැඳී සිටී. තවද ඉංජිනේරු සේවා ඒකක විසින් ගබඩාකර තබා ඇති තොග සහ නඩත්තු කරනු ලබන ඉංජිනේරු උපකරණ පිළිබඳ අධීක්ෂණය කිරීම, ඉංජිනේරු සේවා ඒකක විසින් පවත්වා ගෙන යනු ලබන ගිණුම් අධීක්ෂණය කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාර්යට අයත් වේ. තවද ඉංජිනේරු කටයුතු සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධයෙන් යුද්ධ හමුදාධිපතිට උපදෙස් දීම, ඉංජිනේරු තොග මිළදී ගැනීම, නඩත්තු කිරීම, ගබඩා කිරීම, බෙදාහැරීම සහ ඉවත දැමීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය, ගොඩනැගිලි ඉදිකිරීම, යටිතල පහසුකම් සම්පාදනය සම්බන්ධයෙන් සැළසුම් කිරීම හා ඒ සම්බන්ධ කටයුතු වලදී ඇස්තමේන්තු සකස් කිරීම සහ විශේෂිකරණය කිරීමද මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම් වේ.

9. **<u>සපුරාගත් ඉල්ලකයන්.</u>** 2015 වර්ෂයේදී මාතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල රණවිරු නිවාස ඉදිකිරීම, චාවකච්චේරිය හංවැල්ල ප්‍රදේශවල සතිපොලවල් ඉදිකිරීම, පොළොන්නරුව රාජකීය විද්‍යාලයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම, අනුරාධපුර පුරාවිද්‍යාත්මක කෞතුකාගාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම හා බත්තරමුල්ලෙහි ඉදිකරනු ලබන ත්‍රිවිධ හමුදා මූලස්ථාන සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු සම්බන්ධීකරණය කිරීම ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරනු ලැබීය. මීට අමතරව තංගල්ල හා කුරුණෑගල යන නගරවලද, මීරියබැද්ද නාය යෑමෙන් අවතැන් වූ පුද්ගලයින් සඳහා නිවාස තනා දීමෙන්ද, ත්‍රිපොලි වෙළඳ මධ්‍යස්ථානය ඉදිකිරීම, කතරගම නිවාඩු නිකේතනය ඉදිකිරීම, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකිරීම, දකුණු ආසියානු සංගමය සඳහා මාතර ප්‍රාදේශීය සහයෝගීතා සංස්කෘතික මධ්‍යස්ථානය නිර්මාණය කිරීම හා ජාතික කෞතුකාගාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු දැනටමත් සිදු කරමින් පවතී.





බත්තරමුල්ල ත්‍රිවිධ හමුදා මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම



වෛද්‍ය පීඨ ගොඩනැගිලි සංකීර්ණය - වේරහැර



දකුණු ආසියානු සංගමය සඳහා මාතර ප්‍රාදේශීය සහයෝගීතා සංස්කෘතික මධ්‍යස්ථානය නිර්මාණය කිරීම





මීරියබැද්ද නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය



කතරගම නිවාඩු නිකේතනය




ත්‍රිපොලි වෙළඳ මධ්‍යස්ථානය ඉදිකිරීම

## යුධෝපකරණ මාස්ටර් ජෙනරල් ශාඛාව

1. යුධෝපකරණ මාස්ටර් ජෙනරල් ශාඛාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අවශ්‍ය යුධෝපකරණ නියම තත්වයෙන් හා නියම පරිමානයෙන් නියමිත වේලාවට නියමිත ස්ථානයට සැපයීම මෙම ශාඛාවේ වගකීම වේ. යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය හා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය මෙම ශාඛාවට ඒ සඳහා අවශ්‍ය සහය ලබාදේ. යුධෝපකරණ මාස්ටර් ජෙනරල් ශාඛාව එයට යටත් අධ්‍යක්ෂ මණ්ඩල වල පර්යේෂණ හා ප්‍රවර්ධනය සඳහා මාණ්ඩලික සම්බන්ධීකරණ ආයතනයක් ලෙස ප්‍රධාන මාණ්ඩලික ශාඛාව යටතේ පවතින සැළසුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සහයද ඇතිව ක්‍රියා කරනු ලබයි.

රූප සටහන 14:1 යුධෝපකරණ මාස්ටර් ජෙනරල් ශාඛාව යටතේ ඇති සංස්ථා.




2. **<u>ළඟාකරගත් ඉලක්කයන්.</u>** මෙම වර්ෂය තුළදී මෙහෙයවන ලද හදිසි ආපදා සහන මෙහෙයුම් සහ ව්‍යාපෘති පහත පරිදි වේ:

අ. **<u>යුද්ධ හමුදා කර්මාන්ත ශාලා ව්‍යාපෘතිය.</u>** දොඹගොඩ යුධෝපකරණ ශාලාව කොස්ගම විදුලි සහ යාන්ත්‍රික ඉංජිනේරු වැඩපල හා සම්බන්ධ සියළු කටයුතු යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව විසින් සිදු කරනු ලදි.

ආ. **<u>ජාතික සංවර්ධන ව්‍යාපෘති.</u>** විද්‍යුත් හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරනු ලැබූ ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූලද්‍රව්‍ය මිළදී ගැනීම් හා සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලදි.

ඇ. **<u>නේපාල් හදිසි අවශ්‍යතා.</u>** නේපාල භූමි කම්පා අවස්ථාවේදී ඒ සඳහා යොමුකරන ලද සහන කණ්ඩායම් වලට අවශ්‍ය සියළුම ද්‍රව්‍ය සැපයීමද එම කටයුතු සම්බන්ධීකරණයද යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කෙරිණි.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

3. **මුල්‍ය විස්තරය.** මුල්‍ය විස්තරය පහත පරිදි වේ.

සංඛ්‍යා සටහන 14:1 යුධෝපකරණ මාස්ටර් ජෙනරල් ශාඛාවේ මුල්‍ය විස්තරය.

| අ/අ | වැය ශිර්ෂය | වැය ශිර්ෂ විස්තරය | වාර්ෂික මුදල් ප්‍රතිපාදන (රු:මිලියන) | සම්පූර්ණ වියදම (රු: මිලියන) |
|---|---|---|---|---|
| 1 | 222-01-2-1302 (iii) | බැරැක්ක නඩත්තුව | 15.00 | 12.29 |
| 2 | 222-01-2-1205 (xxiv)<br>222-01-4-1205 (xxiv) | පවිත්‍රතා හා සනීපාරක්ෂ ද්‍රව්‍ය | 14.00 | 15.06 |
| 3 | 222-01-2-1405 (xx) | තාක්ෂණික ඇගයීම් කමිටු දීමනා ගෙවීම | 4.00 | 2.41 |
| 4 | 222-01-3-2103(i)ඒ | යන්ත්‍රෝපකරණ වැය ශිර්ෂය | 378.06 | 453.57 |
| 5 | 222-01-3-2103(vii) | යුධ කණ්ඩායම් වලට පහසුකම් සැපයීමේ වැය ශීර්ෂය | 14.00 | 11.40 |
| 6 | 222-01-1-2502(2) | නව රෝහල් ව්‍යාපෘතිය | 500.00 | 709.33 |

**<u>යුධොපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

4. ශ්‍රි ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකාය සියළුම තාක්ෂණික ගැටළු සම්බන්ධයෙන් යුද්ධ හමුදාධිපතිට වගකිව යුතු වේ. තවද දේශීය සහ විදේශීය වශයෙන් මිළදි ගැනීම් සඳහා භාණ්ඩ නිශ්කාෂණ හා බිල්පත් සහතික කිරිම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

5. **ළඟා කරගත් ඉලක්කයන්.** පහත දැක්වෙන නව ව්‍යාපෘති ආරම්භ කර ඒවායේ ඉදිරි කටයුතු සිදුකරන ලදි:

අ. මූලික යුධෝපකරණ ගබඩාව රාගමට ගෙනයාම.

ආ. 2015 වසරේ සිදුකරන ලද ව්‍යාපෘතිවල විස්තරය පහත පරිදි වේ:

(1) මේස් නිෂ්පාදන කිරීමේ අංශය.
(2) ටයර් නැවත නිෂ්පාදනය කිරීමේ අංශය.
(3) LED විදුලි බුබුලු නිෂ්පාදනය කිරීමේ අංශය.
(4) පතුරොම් පෙට්ටි නිෂ්පාදනය කිරීමේ අංශය.

ඇ. 2015 වර්ෂයේදි දොඹගොඩ යුධෝපකරණ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරනු ලබන යුධෝපකරණ භාණ්ඩ ප්‍රමාණය වැඩි කල අතර එමගින් රු: 112,520,122.71 ක මහජන මුදල් සම්භාරයක් ඉතිරි කරගන්නා ලදි. නිෂ්පාදනය කරන ලද හා පිළිසකර කරන ලද භාණ්ඩ අතර හිස්වැසුම්, නිදන බෑග්, යකඩ ඇඳන් සහ වානේ පුටු, වානේ මේස, ලියුම් කවර, කොඩි සහ නිල ඇඳුම් ආදී ද්‍රව්‍ය වේ.

ඈ. **<u>බැරැක්ක පරිමාණයන් සකස් කිරිම.</u>** යුද්ධ හමුදාවේ සියළුම ආයතන සඳහා ඇවැසි බැරැක්ක භාණ්ඩයන් සඳහා සකස් කරන ලද පරිමාණයන් අනුව නිකුත් කිරීම් සිදු කරනු ලබයි. මෙමගින් ඒකකයන්ට හිමි බැරැක්ක පරිමාණයට අනුව භාණ්ඩ ලබා ගත හැකි අතර මිළදි ගැනීම් සැළැස්ම සඳහාද මෙය උපයෝගී කර ගත හැක.

ඉ. **පතුරොම් නැවත පිරිවීම.** මධ්‍යම අවි සහ පතරොම් ගබඩාවේ පතුරොම් නැවත පිරවීමේ ව්‍යාපෘතිය මගින් අචාර වෙඩි මුර වලදි සහ තරඟ වලදි යෙදා ගන්නා ලද පතුරොම් සහ විවිධ වර්ගයේ සුළු අවි පතුරෙම් නැවත පිරිවීම මගින් පතුරොම් මිළදි ගැනීමට යොදවන මහජන මුදල් සම්භාරයක් ඉතිරි කර ගැනීමට හැකියාව ලැබි ඇත.

6. 2015 වර්ෂයේදි යුධෝපකරණ සැපයීමේ පද්ධතිය සහ වෙනත් කාර්මික ක්‍රියාකාරකම්වල ඵලදායිතාවය සහ කාර්‍යක්‍ෂමතාවය වර්ධනය කිරීමේ අරමුණින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගන්නා ලදි:

අ. යුධෝපකරණ පරීක්‍ෂණ සහ තොග ගණන් ගැනීම.
ආ. වෙඩි ද්‍රව්‍ය පරීක්‍ෂණය.
ඇ. යුධෝපකරණ විශේෂිකරණය හා නිෂ්පාදනය.
ඈ. අවි අංකයන් පරිගණක ගත කිරීම.
ඉ. ප්‍රසම්පාදන ක්‍රියාවලියේදි සේවාදායක බලය භාවිතා කිරිම.

<u>**විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්‍ෂ මණ්ඩලය**</u>

7. ශ්‍රි ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකාය විසින් යුද්ධ හමුදාව සතු සන්නද්ධ රථ, සියළුම වාහන, අවි, සුළු අවි, වායුසමන උපකරණ, ගෘහවිදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ, දෘෂ්ඨි උපකරණ හා ජීව වෛද්‍ය උපකරණ නඩත්තු කිරිම හා අළුත්වැඩියා කිරීම ඉටුකරනු ලබයි. මීට අමතරව ශ්‍රි ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකාය විසින් ලෝහ මුලික නිෂ්පාදන වන යකඩ ඇඳන් කබඩ් සහ පුටු යනාදිය යුද්ධ හමුදාව වෙත නිෂ්පාදනය කරන අතරම ජාතිය ගොඩනැගිමේ ව්‍යාපෘති වන මහජන පොල ඉදිකිරිම බස්නැවතුම්පල ඉදිකිරිම සඳහාද දායකත්වය ලබා දෙන ලදි. වර්ෂය තුළ සම්පුර්ණ පුනරාවර්තන වියදම රු. මිලියන 5206.5 ක් වු අතර සම්පුර්ණ මූලධන වියදම රුඃ මිලියන 1688.07 කි.

8. **<u>සපුරාගත් ඉලක්කයන්.</u>** ශ්‍රි ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනෙරු අධ්‍යක්‍ෂ මණ්ඩලය සපුරාගත් ඉලකක්යන් පහත පරිදි වේ:

අ. අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු නිවැරදි අයුරින් ඉටුකිරිම.

ආ. අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා නව ප්‍රතිපත්ති හඳුන්වාදීම.

ඇ. යුද්ධ හමුදාවේ භාවිතා කරන සියළු රථවාහන සඳහා සම්මත ටයර් කට්ට රටාවක් හඳුන්වාදීම.

ඈ. පිරිවිතරයන් යාවත්කාලීන කිරිම.

ඉ. මුල්‍ය කළමනාකරණ ක්‍රමවේදයට අනුව දින 30 ක් ඇතුළත 98% ක් දක්වා බිල්පත් ඉදිරිපත් කිරිම් ප්‍රතිශතය වැඩි දියුණු කර ගැනීමට හැකි වු අතර ලබාදි ඇති මුල්‍ය ප්‍රතිශතයන්ගෙන් 90% ක් තරම් වු බිල්පත් නිරවුල් කර ගැනීමට හැකිවිම.

ඊ. ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහා සැළකිය යුතු මට්ටමේ දායකත්වයක් ලබාදිම.

උ. යුද්ධ හමුදාව තුළ ලෝහ ආශ්‍රිත නිර්මාණයන්ගේ නිෂ්පාදනයන් වැඩි දියුණු කිරිම.

9. **<u>ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය හා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන ලද සංවර්ධන ව්‍යාපෘති.</u>** ආරක්ෂක අමාත්‍යාංශයේ නගර සංවර්ධන අධිකාරියේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සහ කොළඹ මහ නගර සභාවේ ඉල්ලීම පරිදි පහත සඳහන් ව්‍යාපෘති සිදුකරන ලදි.



ඇහැළියගොඩ සතිපොළ



බණ්ඩාරගම සතිපොළ



හෝමාගම සතිපොළ



අත්තිඩිය සතිපොළ



හංවැල්ල සතිපොළ



තලපත්පිටිය බස් නැවතුම්පල

10. **<u>ක්‍රියාකාරකම් විශ්ලේෂණය සහ ඇගයීම.</u>** ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය හා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් ඇගයීම හා විශ්ලේෂණය පහත පරිදි වේ:

අ. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලඇණි විසින් මෙම වසර තුළදී පසුගිය වසරට වඩා ක්ෂේත්‍ර අළුත්වැඩියාවන් සිදුකරන ලදි. එමෙන්ම විශාල ප්‍රමාණයේ මූලික අළුත්වැඩියාවන් මූලික වැඩපල මගින් සිදු කරන ලදි. එමගින් ඉතාමත් කාර්‍යක්‍ෂම හා සාර්ථක සේවාවන් විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකාය වෙතින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත සිදුකරන ලදි.

ආ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වෙන් කරන ලද ප්‍රතිපාදනයන් නිසි කළමනාකරණයකින් යුතුව යොදා ගැනීමට හැකිවීම හා නිසි කාලසටහනකට අනුව ප්‍රතිපාදනයන් ප්‍රයෝජනයට ගැනීම තුළින් විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු කාර්මික සේවය කාර්‍යක්‍ෂම ලබාදීමට හැකිවීම.

ඇ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ අධීක්‍ෂණය යටතේ කාර්‍යයන් සිදුකිරීම නිසා ලද සම්පත් වලින් උපරිම ඵල නෙලා ගත හැකි වීම.

ඈ. යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් මත ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ වර්ගයේ ව්‍යාපෘතීන් සාර්ථකව නිම කරන ලදි. තවද අපගේ කාර්මික සේවයට පරිබාහිරව ජාතීය ගොඩනැගීමේ ව්‍යාපෘති සඳහාද ඉමහත් දායකත්වයක් ලබා දෙන ලදි.

ඉ. කාර්මික වැඩපල තුළින් විශාල ප්‍රමාණයේ ලෝහ ආශ්‍රිත නිෂ්පාදනයන් කිරීම තුළින් යුද්ධ හමුදාවේ අවශ්‍යතාවය සපුරාලීම මෙන්ම විශාල මුදල් ප්‍රමාණයක්ද ඉතිරි කර ගැනීමට දායකත්වය ලබා දෙන ලදි.

ඊ. කාර්මික දැනුම නිර්මාණශීලි හැකියාව සහ ආකල්ප වැඩිදියුණු කරගැනීමේ අරමුණින් බළකායේ අවශ්‍යතාවය මත නිළධාරි සහ සෙසු නිළයන් පුහුණු කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලැබුණි.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## අධ්‍යක්ෂ ජෙනරාල් පාබල කාර්යාලය

1. මෙම කාර්යාලය පාබල රෙජිමේන්තු වල විශේෂිත වු කාර්‍යයන් අධීක්ෂණය කරනු ලබයි. පාබල රෙජිමේන්තු සඳහා වු ප්‍රතිපත්තිමය කරුණු බලඇණි පුහුණුවීම් හා විශේෂ පාබල ක්‍රියාන්විත පුහුණුවීම් අධීක්ෂණය හා සම්බන්ධීකරණය කිරීම මෙම කාර්යාලයේ ප්‍රධාන කාර්‍යයන් වේ. තවද පාබල බලඇණිවල මූලික අවශ්‍යතාවය වන යුධ/පාලන උපකරණ සංඛ්‍යා ලේඛණ නඩත්තුව හා ඒ පිළිබඳව වන නිරීක්ෂණයන් හා ගත යුතු ක්‍රියාමාර්ගයන් යුද්ධ හමුදා මුලස්ථානය වෙත දැනුම්දීම හා මධ්‍යස්ථාන සේනාවිධායකවරුන් සමඟ පාබල හමුදාවට අදාල කරුණු සාකච්ඡා කර පොදු තීරණ ප්‍රකාශයට පත්කරනු ලබයි. බලඇණි පුහුණු පාසැල් හා වෙනත් යුද්ධ හමුදා පුහුණු ආයතන වල පුහුණු කටයුතු නිරීක්ෂණය කිරීම සහ අවි ආයුධ යුධ උපකරණ හා ඒවායේ ඡායාරූප ඇතුළත් ප්‍රදර්ශණ කුටි සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීම මෙම කාර්යාලයේ සෙසු කාර්යයන් වේ.

### සපුරාගත් ඉලක්කයන්

2. **පුහුණුවීම්.** මෙම වර්ෂය තුළදි බලඇණි පුහුණු හා විශේෂ පාබල ක්‍රියාන්විත පුහුණු පාඨමාලාව මෙහෙයවීම තුළින් සෙබළුන්ගේ යුධ ශිල්ප දැනුම, කාර්‍යක්ෂමතාවය, චිත්ත ධෛර්‍යය, සාමුහික හැගීම, කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ හැකියාව සහ විනය වර්ධනය කිරීම ඒ සඳහා සහභාගී වු සාමාජිකයින්ගේ විස්තර පහත පරිදි වේ:

අ. **බලඇණි පුහුණු.** මෙම වර්ෂය තුළදි බලඇණි පුහුණු 63 ක් මෙහෙයවු අතර නිළධාරින් 756 ක් හා සෙසු නිලයන් 19563 ක් පුහුණුව ලබාගන්නා ලදි.

ආ. **විශේෂ පාබල ක්‍රියාන්විත කණ්ඩායම**. මෙම වර්ෂය තුළදි විශේෂ පාබල ක්‍රියාන්විත කණ්ඩායම් 02 ක් පාඨමාලාව සම්පුර්ණ කරන ලද අතර නිළධාරින් 28 ක් හා සෙසු නිළයින් 407 ක් මෙමගින් සුදුසුකම් ලැබිය.



වනයට අනුගත වීම




යථාර්තවාදි පුහුණුව



වන සටන් පුහුණුව



වැලි ආකෘති විස්තර කිරිම

## මුලස්ථානය භට කාර්ය සම්පාදන අණසක

1. භට කාර්ය සම්පාදන අණසක මුලස්ථානය වෙත සියළුම ඉදිරි නඩත්තු ප්‍රදේශයන් හා නිත්‍ය හමුදා සේවා ඒකකයන්හි පාලනමය කටයුතු රෙජිමේන්තු මධ්‍යස්ථාන හරහා පාලනය කිරීමට වගකීම පැවරී ඇත.

**<u>ප්‍රධාන කාර්යයන් හා ප්‍රගතිය</u>**

2. **<u>වෘත්තිය පරීක්ෂණ.</u>** මෙම වර්ෂය තුළදී වෘත්තිය පරීක්ෂණ 74 ක් මෙහෙය වන ලදී.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## <u>ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලය</u>

1. ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලයේ වගකීම වනුයේ ක්ෂේත්‍ර රාජකාරී සහ ව්‍යාපෘති රාජකාරී බළකාය වෙත පැවරීම සහ අධීක්ෂණය කිරීමයි. යුද්ධ හමුදාධිපතිතුමාට හා යුද්ධ හමුදා මූලස්ථානයට අවශ්‍ය ක්ෂේත්‍ර ඉංජිනේරු රාජකාරී පිළිබඳ උපදේශකත්වය ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු විසින් ලබාදිය යුතුය.

2. **<u>සපුරාගත් ඉලක්කයන්.</u>** මෙම කාලසීමාව තුළ ඉංජිනේරු බළකාය ආරක්ෂක සහ ජාතික සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා දායකත්වය ලබා දෙන ලදි. ඒ යටතේ ප්‍රධාන වශයෙන් බේරුවල කඩලන්දුව ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කරන ලදි.



බේරුවල කඩොලන්දුව පාලම



කොළඹ රාජකීය විදුහලේ ක්‍රීඩා සංකීර්ණය

3. රජයේ සංවර්ධන ව්‍යාපෘතීන් සහ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතීන් වන වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම, කඳවුරු වගාකිරීම සඳහා භූමිය සකස් කිරීම සහ විවිධ ආයතන ඉදිකිරීම සඳහා භූමිය සකස් කිරීම ඉන් ප්‍රධාන වේ. ඊට අමතරව කොළඹ රාජකීය විද්‍යාලයේ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම, සිරිමාවෝ බණ්ඩාරණායක විද්‍යාලයේ ගෘහස්ත ක්‍රීඩාගාරය ඉදිකිරීම හා මොරගහහේන බස් නැවතුම ඉදිකිරීම මෙම වසරේ සිදු කරන ලද ප්‍රධාන ව්‍යාපෘතීන් වේ. එමෙන්ම අවතැන්වූවන් නැවත පදිංචි කිරීම සඳහා මානුෂවාදී බිම්බෝම්බ ඉවත් කිරීමේ රාජකාරි වඩාත් කාර්‍යක්ෂමව ඉටුකිරීම සඳහා අවශ්‍ය භෞතික හා උපකරණ ලබාදීමෙන් වැඩි දායකත්වයක් ලබා දෙන ලදි. ශක්තිමත් හා නිදහස් රටක් නිර්මාණය කිරීම සඳහා ඉටුකරන ජාතික මෙහෙවරට ඉංජිනේරු බළකාය සෘජුවම දායකත්වය ලබාදී ඇත.

4. **<u>2015 වර්ෂයේ සිදුකරන ලද ශාකාත්‍යා සංවර්ධන වැඩසටහන්.</u>** සාම්ප්‍රදායික ක්‍රමවේදයන්ට පරිබාහිරව සංවිධානයේ ධාරිතාව ඉහළ නංවා කාර්යක්ෂම හා ඵලදායි සේවයක් ලබාගැනීමට පහත සඳහන් පියවර ගෙන ඇත:

අ. බෝම්බ නිෂ්ක්‍රීය බලසෙණයෙහි රාජකාරීන් ඉහළ නැංවීමට සිදු විය හැකි සංසිද්ධීන්ට මුහුණදීමට හැකිවන පරිදි රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණශීලී හා න්‍යෂ්ඨික සහ ආපදා කළමනාකරණ යන අංශ ඇතුලත්ව 14 වන ස්වාධීන ඉංජිනේරු රෙජිමේන්තුව පිහිටුවීම හා අනාගත අභියෝග වලට මුහුණදීමට හැකිවන පරිදි ස්වාධීන වැඩපල ප්‍රතිසංවිධානය කිරීම .

ආ. ඉංජිනේරු බළකායේ කාලයක සිට පැවැති අවශ්‍යතාවයක් සපුරාලමින් පුපුරණ ද්‍රව්‍ය හඳුනා ගැනීමේ සුනඛ අංශය ස්ථාපිත කිරීම. මෙය සෝදිසි මෙහෙයුම් හා වැදගත් පුද්ගලයන්ගේ ආරක්ෂක රාජකාරීන් සඳහා වැදගත් වේ.

ඇ. ඉංජිනේරු බලසේනා මූලස්ථානය යටතේ භූගෝලීය තොරතුරු විශ්ලේෂණ අංශයක් හා මිනින්දෝරු කණ්ඩායමක් ස්ථානගත කර භූමි නිරීක්ෂණ කටයුතු වලට හා භූමි දත්ත විවිධ පැතිකඩයන් ඔස්සේ ලබා ගෙන තත්කාලීන භූගෝලීය දත්ත ලෙස ඉදිරිපත් කිරීමට සැළසුම් යොදා ගැනීම.

ඈ. මානුෂවාදී බිම්බෝම්බ ඉවත් කිරීමේ කාර්යක්ෂමතාව වර්ධනය සඳහා ඇමරිකා එක්සත් ජනපද තනාපති කාර්යාලයේ සහය ඇතිව ඉංජිනේරු බලසේනා මූලස්ථානය යටතේ බිම්බෝම්බ ඉවත් කරන්නන්ගේ මූලික පාඨමාලාව හා වෛද්‍ය සහයක පාඨමාලා ක්‍රියාත්මක කිරීම.

5. **<u>2015 වර්ෂයේදී ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලය වෙතින් සිදුකරන ලද ව්‍යාපෘති.</u>** ශ්‍රී ලංකා යුද්ධ හමුදා දීප ව්‍යාප්තව පවතින ඉදිකිරීම් ප්‍රතිසංස්කරණය කිරීම්, බිම් සැකසීමේ ව්‍යාපෘති වැනි ජාතිය ගොඩනැගීමේ ව්‍යාපෘති සඳහා සෘජු දායකත්වයක් ලබා දෙන ලදි. යුද්ධ හමුදා ක්ෂේත්‍ර ඉංජිනේරුවන් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, මාර්ග සන්නිවේදන ජාලය පිළිසකර කිරීම, අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සඳහා කැළෑබද ප්‍රදේශ එළි පෙහෙළි කිරීම කෙරෙහි වැඩි දායකත්වයක් ලබා දෙන ලදි. මීට අමතරව මාහාමාර්ග සහ ක්‍රීඩාංගණ ඉදිකිරීම, වැව් අමුණු පිළිසකර කිරීම වැනි ව්‍යාපෘති සඳහාද සහය ලබාදී ඇත. මේ අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලයේ අධීක්ෂණය යටතේ රු: 295,256,602.47 ක වටිනාකමකින් යුත් ව්‍යාපෘති සම්පූර්ණ කරන ලදි.



මූණමල්වත්ත පාලම



සූරියවැව කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ දක්ෂිණ පීඨයේ මාර්ගය ඉදිකිරීම



මොරගහහේන බස් නැවතුම්පල



ඉමදුව සතිපොල

6. **<u>මූල්‍ය විස්තරය.</u>** මෙම වර්ෂය තුළදී මූල්‍ය වැය ශීර්ෂ විස්තරය පහත සඳහන් පරිදි වේ.

සංඛ්‍යා සටහන 17:1 2015 වර්ෂයේදී ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලයේ මූල්‍ය විස්තරය.

| අ/අ | විස්තරය | වෙන්කරන ලද මුළු මුදල් ප්‍රමාණය | 2014 වර්ෂයේ ඇතිවූ බැදීම් වල වටිනාකම | බැදීම් අඩු කල පසු ඉතිරි ප්‍රතිපාදන මුදල | මුළු වියදම | වැය ශීර්ෂයේ ඉතිරි මුදල |
|---|---|---|---|---|---|---|
| 1 | 222-01-3-2002(I) යන්ත්‍ර උපකරණ | 70,000,000.00 | 4,905,243.21 | 65,094,756.79 | 65,083,291.74 | 11,465.05 |
| 2 | 222-01-2-1205(xxii) යන්ත්‍ර උපකරණවල අමතර කොටස් | 116,000,000.00 | 2,334,412.14 | 113,665,587.86 | 113,181,692.24 | 483,895.62 |
| 3 | 222-01-2-1205 (xxiii) සී කාණ්ඩයේ අමතර කොටස් | 85,000,000.00 | - | 85,000,000.00 | 63,149,516.90 | 21,850,483.10 |
| 4 | 222-01-2-1302 (V) යන්ත්‍ර උපකරණ | 35,000,000.00 | 728,411.50 | 34,271,588.50 | 33,791,405.35 | 480,183.15 |
| 5 | 222-01-2-1401 (iv) යන්ත්‍ර සහ උපකරණ කුලී පදනම මත ලබාගැනීම | 4,000,000.00 | 2,037,840.00 | 1,962,160.00 | 276,549.80 | 3,723,450.20 |
| 6 | 222-01-2-1205(viii) ක්ෂය ද්‍රව්‍ය වැය ශීර්ෂය | 4,500,000.00 | - | 4,500,000.00 | 4,424,212.76 | 75,787.24 |
| | **එකතුව** | **314,500,000.00** | **10,005,906.85** | **304,494,093.15** | **279,906,668.79** | **26,625,264.36** |

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

7. **වාර්ෂික ක්‍රියාකාරකම්ල විශ්ලේෂණය හා ඇගයීම.** ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නැවත අනුයුක්ත කිරීමේ සැළසුම් සහ ජාතික සංවර්ධන සැළසුම් සමග යාන්ත්‍රික ඉංජිනේරු කාර්යයන් සඳහා ඇති ඉල්ලීම වැඩිවීමත් සමඟ හමුදාමය ඉංජිනේරු කාර්යයන් සඳහා ඇති ඉල්ලීම අඩු විය.

8. රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය යුද්ධ හමුදා ක්ෂේත්‍ර ඉංජිනේරු ව්‍යාපෘති පිළිබඳව පැහැදීම හේතුවෙන් අනාගත ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් භාරදීම වැඩි වී ඇත. නිර්මානකරණය, මිනින්දෝරු කටයුතු, විශේෂ උපකරණ හා සම්බන්ධ විධිමත් වෘත්තිකයන්ගේ හිගකම නිසා සිවිල් ගොඩනැංවීමේ ව්‍යාපෘති ස්වාධීනව භාරගැනීමට නොහැකි වී තිබේ.

9. ශ්‍රී ලංකා යුද්ධ හමුදා බිම්බෝම්බ ඉවත් කිරීමේ ඒකකය ශ්‍රී ලංකාවේ දැනට පවතින විශාලතම බිම්බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන් සඳහා දායකවන ආයතනය වුවද නිපුණ බිම්බෝම්බ ඉවත් කරන්නන්ගේ හිගකම එම වැඩසටහන් වල කාර්‍යක්ෂමතාවය අඩු වීම කෙරෙහි බලපා ඇත.

10. දැනට යුද්ධ හමුදාව සතුව ඇති බොහෝ බෝම්බ නිෂ්ක්‍රීය උපකරණ යල් පැන ගිය උපකරණ වන අතර බෝම්බ නිෂ්ක්‍රීය බළසණ දෙකක් සඳහා යොදා ගැනිමට එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන් හා නිවැරදි පුහුණුවීම් සඳහා යන සියළු අවශ්‍යතා පිරිමසා ගැනීමට ප්‍රමාණවත් නොවේ.

11. විශ්‍රාම ගැනීමේ අනුපාතය වැඩිවීම නිසා හා බඳවා ගැනීමේ අනුපාතය අඩුවීම ඒකකවල භටපිරිස් ඌණතාවය ප්‍රධාන හේතුවක් වන අතර උසස් මුලස්ථාන රෙජිමේන්තු මධ්‍යස්ථාන හා අත්‍යාවශ්‍ය පුහුණු පාඨමාලා විශේෂිත වු පුහුණුවීම් සඳහා භටපිරිස් මුදවා හැරීමට සිදුවීම සංග්‍රාමික කාර්යක්ෂමතාවයට අහිතකර ලෙස බලපා ඇත.

12. **ලගා කරගත නොහැකි වු ඉලක්කයන්.** ලගා කරගත නොහැකි වු ඉලක්කයන් පහත පරිදි වේ:

අ. ක්ෂේත්‍ර ඉංජිනේරු වෘත්තියෙහි යෙදි සිටින්නන් හට නවීන තාක්ෂණික ශිල්පිය ක්‍රමවේදයන් හා නවීන උපකරණ භාවිතය පිළිබඳ පුහුණුව ශ්‍රී ලංකා යුධ ඉංජිනේරු පාසල තුළින් ලබාදිම.

ආ. භූ ලක්ෂණ තොරතුරු විශ්ලේෂණ ඉංජිනේරු රෙජිමේන්තුව (GIS) පිහිටුවා යුද්ධ හමුදා තීරණ ගැනිමේ ක්‍රියාවලියට (MDMP) යුධ ඉංජිනේරු ශිල්පයට හා රාජ්‍ය/රාජ්‍ය නොවන ආයතන බිම්වෙඩි ඉවත් කිරීමේ අංශ හා ආපදා කළමනාකරණයට අදාල භූ ලක්ෂණ තොරතුරු සැපයීම හා බෙදාගැනිම.


ඇ. වර්ථමාන මාර්ග ඉදිකිරීමේ හැකියාව නවීන ක්‍රම දක්වා දියුණු කර බාහිර සේවා සැපයුම්කරුවන් වෙත යන මුදල් ප්‍රමාණය යුද්ධ හමුදාව තුල ඉතිරි කරගැනිම සහ අනාගතයේදි සිවිල් ව්‍යාපෘති භාරග ැනිම සඳහා මෙන්ම එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා ඉංජිනේරු කණ්ඩායම් ස්ථානගත කිරීමට අවස්ථාව ලබාගැනීම.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## ප්‍රධාන සංඥා නිළධාරි කාර්යාලය

1. ප්‍රධාන සංඥා නිළධාරි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝග පාලන සහ සන්නිවේදන පරිගණක බුද්ධි අංශ තොරතුරු හා පරිපාලන කටයුතුවල නිර්වද්‍යතාවය පිළිබඳ වගකිව යුතු වේ. ප්‍රධාන සංඥා නිළධාරි කාර්යාලයේ ආයතන ව්‍යුහය පහත පරිදි වේ.

රූප සටහන 18:1 ප්‍රධාන සංඥා නිළධාරි කාර්යාලය යටතේ ඇති සංස්ථා.




**වාර්ෂික කාර්ය සාධනය**

2. මෙම වර්ෂය තුළදී ප්‍රධාන සංඥා නිළධාරි කාර්යාලයේ අධීක්ෂණය යටතේ ක්‍රියාවට නැංවූ ව්‍යාපෘති වල විස්තරය පහත පරිදි වේ:

අ. **රේඩියෝ සන්නිවේදනය.** ශ්‍රී ලංකා යුද්ධ හමුදා මුලස්ථානයේ මග පෙන්වීම යටතේ යුධ අභ්‍යාස උත්සව සහ විශේෂ අවස්ථා 181 ක් සඳහා අවශ්‍ය රේඩියෝ සන්නිවේදන පහසුකම් ලබා දෙන ලදි.

ආ. **රැහැන් සන්නිවේදනය.** නවතමයෙන් ස්ථාපිත කරන ලද මුලස්ථාන ආයතන හා පුහුණු ආයතන සඳහා නව හුවමාරු මධ්‍යස්ථාන ඉදිකරමින් සන්නිවේදන පහසුකම් සපයන ලදි. එමෙන්ම දැනට පවතින පහසුකම් උපයෝගී කරගනිමින් සන්නිවේදන පහසුකම් වැඩි දියුණු කරන ලදි.

ඇ. **ජංගම සන්නිවේදන ජාලය.** ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ජංගම සන්නිවේදන ජාලය වැඩිදියුණු කිරීම සඳහා සහය ලබා දෙන ලදි. උතුරු නැගෙනහිර සහ වෙනත් දුෂ්කර පළාත් දක්වා ජංගම සන්නිවේදන ජාලය පුළුල් කරන ලදි.

ඈ. **රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය.** ක්‍රියාන්විතයේදී මියගිය නිළධාරින්/ සෙසුනිළයින්ගේද සහ දැනට සේවයේ නියුතු හා විශ්‍රාම ගිය නිළධාරින්ගේ සහ සෙසුනිළයින්ගෙ ්ද ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සහ නෑදෑයන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම ඉහළ නැංවීමේ අරමුණින් මෙම ආයතනය ස්ථාපිත කරන ලදි.

3. **ආලෝක වහන ඩයෝඩ තිර සේවා.** ශ්‍රී ලංකා යුද්ධ හමුදා උත්සව අවස්ථා 30 ක් සඳහා ජංගම ඩයෝඩ තිර 02 ක්, ස්ථිර ඩයෝඩ තිර 02 ක් සහ ගෘහස්ත තිරයක් සම්පාදනය කරන ලදි.

4. **මහජන ඇමතීමේ සේවා සැපයීම.** ශ්‍රී ලංකා යුද්ධ හමුදා 10 වන සංඥා බළකාය මගින් ප්‍රධාන ජාතික උත්සව සහ යුද්ධ හමුදා උත්සව සඳහා මෙම සේවාව සපයන ලදි. අනෙකුත් යුද්ධ හමුදා උත්සව සඳහා ආවේණික සංඥා බළකායට අයත් මධ්‍යම වැඩපල හා අදාල අනෙකුත් සංඥා වැඩපලවල් මගින් මෙම සේවා සපයන ලදි.

5. **තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති.** 2015 වර්ෂයේදි සංවර්ධනය කරන ලද මෘදුකාංග සේවා පහත පරිදි වේ.

අ. **දෛනික ලිපි හුවමාරු කිරීමේ පද්ධතිය.** මෙම පද්ධතිය වර්ධනය කිරීමේ අරමුණු පහත පරිදි වේ.

(1) ශ්‍රී ලංකාවේ යුද්ධ හමුදාවේ මුද්‍රණ කඩදාසි නාස්තිය අවම කරගැනිම.
(2) ශ්‍රී ලංකාවේ යුද්ධ හමුදාවට කඩදාසි වලින් තොර නව සංකල්පය හඳුන්වාදීම.
(3) සාමාන්‍ය ලිපි හුවමාරු කිරීමේ සේවයේදි ඒ සඳහා ගත වන කාලය අවම කරගැනීම.
(4) කර්යාලීය රාජකාරිවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරිම.

ආ. **වත්කම් කළමනාකරණ පද්ධතිය.** මෙම පද්ධතිය වැඩිදියුණු කර ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සියළුම වත්කම් මධ්‍යස්ථාන වෙත බෙදාහරින ලදි. මෙම පද්ධතිය සංවර්ධනය කිරිම තුළින් ඒකක වාර්තා සකස් කොට එම වාර්තා වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යැවීම බලාපොරොත්තු වන ලදි.

6. **තොරතුරු තාක්ෂණ මෙහෙයුම් සම්පාදනය.** යුද්ධ හමුදාවේ ආයතන 94 ක පරිගණක ක්‍රියාකරු පුරප්පාඩු සම්පූර්ණ කරන ලදි.

7. මීට අමතරව සන්නිවේදන කාර්යභාර්යට අයත් විවිධ වැඩසටහන් ඒකාබද්ධ අභ්‍යාස පාඨමාලා (දියකාවා අභ්‍යාස පාඨමාලාව) අනෙකුත් සහෝදර සේවා හා සම්බන්ධව විජයග්‍රහණ පෙළපාලිය නිදහස් පෙළපාලිය වැනි අවස්ථාවලදි අවශ්‍ය සන්නිවේදන පහසුකම් සැපයීම.

8. **තැපැල් ඡන්ද සේවාව**. සැළසුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සහය ඇතිව ඡන්ද වඩාත් කඩිනමින් හා වඩාත් කාර්යක්ෂමව හැසිරවීමේ අරමුණින්ද යුද්ධ හමුදාවේ නිසි ක්‍රියාකාරීත්වයට අවශ්‍ය අතිරේක අරමුදල් ලබා ගැනිමට, විශේෂ කාර්යභාර්යන් ඉටුකරගැනිමට හා අතිරේක අවශ්‍යතා සපුරාගැනිමට මෙම සේවය හඳුන්වා දෙන ලදි.

9. **සපුරාගත් ඉලක්ක.** ප්‍රධාන සංඥා නිළධාරි කාර්යාලයට අයත් ආයතනවල උන්නතිය උදෙසා පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදි.

අ. සංඥා රෙජිමේන්තුවල ව්‍යුහය නැවත සකස් කරමින් එම රෙජිමේන්තු බලගැන්වීම මගින් වර්ථමානයේ පවතින සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය වන පරිදි නව තනතුරු සහ ආයතන උත්පාදනය කර ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට නියමිතව ඇත.

ආ. වර්තමාන තොරතුරු තාක්ෂණ අවශ්‍යතාවයක් වන තොරතුරුවල ආරක්ෂණය සඳහා සයිබ ආරක්ෂණ ඒකකයක් ස්ථාපිත කිරිම.

ඇ. 5 වන සංඥා බළකාය සන්නිවේදන කටයුතු සඳහා ආවේණික බළකායක් බවට පරිවර්තනය කරමින් බටහිර ආරක්ෂක සේනා මුලස්ථානයේ සන්නිවේදන රාජකාරි සඳහා අවශ්‍ය භ්‍යපිරිස් වල පුරප්පාඩු සම්පූර්ණ කරන ලදි.

ඈ. 6 වන සංඥා බළකාය තොරතුරු තාක්ෂණ ඒකකයක් ලෙස පරිවර්ථනය කිරීමට අවශ්‍ය ශ්‍රී ලංකා යුද්ධ හමුදා මුලස්ථානයේ අනුමැතිය ලැබි ඇත. මේ තුළින් ආරක්ෂක සේනා මුලස්ථානය (වන්නි), ආරක්ෂක සේනා මුලස්ථානය (කිළිනොච්චි), ආරක්ෂක සේනා මුලස්ථානය (මුලතිව්) හා ආරක්ෂක සේනා මුලස්ථානය (යාපනය) යටතේ ඇති යුද්ධ හමුදා සංස්ථාවල තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම බලාපොරොත්තු වේ.

10. නිර්දේශයන් සහ අනාගත සැළසුම්.

අ. හඩ සහ දත්ත ජාල ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘති යුද්ධ හමුදාවේ යුද්ධ හමුදා මුලස්ථානයේ සිට බලසේනා මුලස්ථාන දක්වා ව්‍යාප්ත කරමින් තොරතුරු සන්නිවේදන තාක්ෂණය දියුණු කිරිම.

ආ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ පිරිස් බලය, සම්පත් සහ දියුණු තාක්ෂණ ක්‍රමයෙන් වැඩි වන ඉල්ලුමට සරිලන පරිදි සංඥා බළකා ආයතන ව්‍යුහයන් සංශෝධනය කිරිම.

ඇ. සහෝදර සේවා වලට පෞද්ගලික ආයතන වලට රටේ දැනට පවතින සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය සන්නිවේදන පහසුකම් හා සබැදි කාර්මික සහය ලබාදිම.

ඈ. සංඥා බළකා වලට අයත් භටපිරිස් සහ අනෙකුත් යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා නවීන සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ වෘත්තීය දැනුම ලබාදීම.


ඉ. පර්යේෂන සහ සන්නිවේදන ව්‍යාපෘති වැඩිදියුණු කිරිම තුළින් වැඩි වන සන්නිවේදන ඉල්ලුමට පිලිතුරු සැපයීම සහ දැනට ආයතනයේ පවතින සම්පත් නවීකරණය කිරිම තුළින් අවශ්‍යතා සපුරාලීම.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය

1. යුද්ධ හමුදා මුලස්ථානය යටතේ ක්‍රියාත්මක වන මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන මාණ්ඩලික නිළධාරි හරහා යුද්ධ හමුදාධිපතිට වගකිව යුතු වේ.

2. ජාතික මට්ටමේ, කළාප මට්මමේ සහ ජාත්‍යයන්තර මට්ටමේ ජයග්‍රහණ ලබාගනු වස් විනය සහ ඒ සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සකස් කිරීම මෙම කාර්යාලයේ කාර්ය භාර්යයන් වේ. මීට අමතරව ක්‍රීඩා අධ්‍යක්ෂ යටතේ සිදු කරන උත්සව සංවිධානය යුද්ධ හමුදා ක්‍රීඩා තරගාවලි සහ ක්‍රීඩා කණ්ඩායම් සඳහා අවශ්‍ය තරගකරුවන් තෝරා ගැනීම යුද්ධ හමුදා ක්‍රීඩා සංචිතයේ සියළුම අධීක්‍ෂණ සහ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම යුද්ධ හමුදා ක්‍රීඩා කණ්ඩායම් සඳහා සුදුසු පුහුණුකරුවන් තෝරාගැනීම හා එම කණ්ඩායම්වල සාමාජිකයන් හා සැබැදි ක්‍රීඩකයන්ගේ සම්බන්ධීකරණය, කළමනාකරණය සහ පරිපාලනමය කටයුතු සඳහා වගකිව යුතු වේ.




බළලත් නිළධාරි 1 බිළුල් නදීකා ලක්මාලි 2015 ලෝක යුද්ධ හමුදා ක්‍රීඩා තරගාවලියේ හෙල්ල විසිකිරීමේ තරගාවලියේ ලෝකඩ පදක්කම දිනා ගන්නා ලදි.



2015 පොදු රාජ්‍ය මණ්ඩලීය කරාටේ ශූර තරගාවලිය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහභාගී වී රන් පදක්කම් 02 ක්, රිදී පදක්කම් 02 ක් සහ ලෝකඩ පදක්කම් 05 ක් දිනාගන්නා ලදි.



2015 පොදු රාජ්‍ය මණ්ඩලීය ශූරතා තරගාවලියේ සාමාන්‍ය සෙබළ බණ්ඩාර කේඩබ්ලිව්එම්එස්ආර්ජේ විසින් රන් පදක්කමක් හා රිදී පදක්කමක් දිනාගන්නා ලදි.




2015 ලෝක යුද්ධ හමුදා ක්‍රීඩා තරගාවලියේ සාමාන්‍ය සෙබළ අබේකෝන් ඒඑම්යුපි විසින් ලෝකඩ පදක්කමක් දිනාගන්නා ලදි.

3. **<u>2015 වසරේ ලඟා කර ගත් ඉලක්කයන්.</u>** 2015 වසරේදි ජාත්‍යයන්තර හා ජාතික ක්‍රීඩා ඉසව් වලින් ලද ජයග්‍රහණ පහත පරිදි වේ.

සංඛ්‍යා සටහන 19:1 2015 වසරේදි ලබාගත් ක්‍රීඩා ජයග්‍රහණ .

| අ/අ | ක්‍රීඩා ඉසව්ව | රන් | | රිදී | | ලෝකඩ | |
|---|---|---|---|---|---|---|---|
| | | ජාත්‍යායන්තර | ජාතික | ජාත්‍යායන්තර | ජාතික | ජාත්‍යායන්තර | ජාතික |
| 1 | මළල ක්‍රීඩා | 5 | 17 | 12 | 20 | 7 | 16 |
| 2 | පැසිපන්දු | - | 1 | 1 | - | - | - |
| 3 | බේස්බෝල් | - | - | - | 1 | - | 2 |
| 4 | බොක්සින් | - | 9 | - | 11 | - | 17 |
| 5 | බිලියට් සහ ස්නූකර් | - | - | - | - | - | 2 |
| 6 | බයිසිකල් පැදීම | 2 | 2 | | 2 | - | - |
| 7 | ක්‍රිකට් | - | 1 | - | - | - | - |
| 8 | එල්ලේ | - | 6 | - | 6 | - | - |
| 10 | ජිම්නාස්ටික් | - | 1 | - | 3 | - | 1 |
| 11 | අත්පන්දු | - | - | - | 1 | - | - |
| 12 | හොකී | - | 2 | - | 1 | - | 2 |
| 13 | ජුඩෝ | - | 6 | - | 9 | - | 12 |
| 14 | කබඩි | - | - | - | - | 2 | - |
| 15 | කරාටේ | 2 | 5 | 4 | 8 | 12 | 23 |
| 16 | දැල්පන්දු | 1 | - | - | 1 | | 2 |
| 17 | ශාරිර වර්ධන ක්‍රීඩා, බර ඉසිලීම් | - | 31 | - | 13 | 1 | 8 |
| 19 | ඔරු පැදීම | - | 41 | - | 31 | - | 20 |
| 20 | රග්බි සහ පාපන්දු | - | 3 | - | 2 | - | 1 |
| 21 | පාපන්දු (Soccer) | - | - | - | 1 | - | 1 |
| 22 | වෙඩිතැබීම් | 14 | 18 | 14 | 26 | 15 | 18 |
| 23 | පිහිනුම් සහ ජල ක්‍රීඩා | - | 11 | - | 20 | 2 | 31 |
| 26 | තයිකොනඩෝ (Taekwondo) | 12 | 9 | 8 | 12 | 3 | 10 |
| 27 | ටෙනිස් | 1 | 3 | 1 | - | 3 | - |
| 28 | රෙස්ලින් | - | 3 | - | 4 | - | 7 |
| 29 | වුෂු | 6 | 16 | - | 10 | 3 | 3 |
| 30 | කැරම් | - | - | 1 | 8 | - | 1 |
| | **එකතුව** | **43** | **185** | **41** | **190** | **48** | **177** |

**යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරල් කාර්යාලය**

1. යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ අවශ්‍යතාවය අනුව පුරප්පාඩු සපුරා ගැනීමට වෛද්‍ය හා අතුරු වෛද්‍ය වෘත්තිකයින් බඳවා ගැනීමේ සියළු සම්බන්ධීකරණ කටයුතු සිදුකිරිම, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇතිවන ඉදිරි අභියෝග වලට මුහුණදීමට සුදුසු පරිදි සේවයේ නියුතු සියළු වෛද්‍ය වෘත්තික සාමාජිකයින්ගේ වෘත්තිය හැකියාවන් වර්ධනය කිරීම සඳහා කටයුතු කිරිම, සියළු යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ඉහල සෞඛ්‍ය කාර්‍යක්ෂමතාවය සඳහා සිදුකිරිම සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාල ක්‍රමෝපායන් සකස් කිරිම.

2. **ප්‍රධාන ක්‍රියාකාරකම්.** මෙම වසර තුළදි පහත දැක්වෙන ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කරන ලදි:

අ. යුද්ධ හමුදාධිපතිගේ අනුමැතිය මත සෞඛ්‍ය අමාත්‍යාංශය සමග සම්බන්ධතාවයෙන් යුතුව විශේෂ ජාතික ඩෙංගු මර්ධන වැඩසටහන්, ඉන්ෆලුන්සා හා හෙපටයිටිස් නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

ආ. යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීමේ අරමුණින් යුතුව මීට පෙර ආරම්භ කරන ලද ‘නිරෝගිමත් දැයක්’ වැඩසටහන ආරක්ෂක සේනා මුලස්ථානය (නැගෙනහිර) බල ප්‍රදේශයේ සේවය කරන යුද්ධ හමුදා සාමාජිකයින් 7000 ක් සහ ආරක්ෂක සේනා මුලස්ථානය (බටහිර) බල ප්‍රදේශයේ සේවය කරන යුද්ධ හමුදා සාමාජිකයින් 12000 ක් වෙනුවෙන් ක්‍රියාත්මක කිරිම.

ඇ. එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි වෙනුවෙන් සුඩාන් හි ස්ථාපිත කර ඇති දෙවන මට්ටමේ රෝහලේ රජකාරි හා ලෙබනන් රජ්‍ය වල සාම සාධක රාජකාරි සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යන ලද යුද්ධ හමුදා භටපිරිස් හට වෛද්‍ය පහසුකම් පිළිබඳව උපදෙස් ලබාදිම හා ඒ සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදුකිරිම අධීක්ෂණය කිරිම.

ඈ. රණක්ෂිතයට පත් රණවිරුවන් සහ වෙනත් හේතුන් මත තුවාල ලබා ඇති යුද්ධ හමුදා සාමාජිකයින් හට පුනරුත්ථාපන කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් ලබාදිම හා ඒ සැබැදිව අධීක්ෂණය කිරිම.

ඉ. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් ශ්‍රී ලංකාවේ මුඛ පිළිකා අවම කිරිම සඳහා ක්‍රියාත්මක කරන ලද මුඛ පිළිකා ප්‍රතිකාර වැඩ සටහන යටතේ යුද්ධ හමුදා සාමාජිකයින් වෙනුවෙන් පූර්ව මුඛ පිළිකා හදුනා ගැනිම සහ ප්‍රතිකාර සැබැදි සායනයන් පැවැත්වීම.

ඊ. යුද්ධයේදි රණක්ෂිතයට පත් වු රණවිරුවන් වෙනුවෙන් අත්තිඩිය මිහිදු සෙත් මැදුරෙහි නව දන්ත වෛද්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කිරිම.

3. **ගැටළු සහ අභියෝග.** පහත සඳහන් ගැටළු සහ අභියෝග අනාගතයේදි නිරාකරණය කරගැනීමට ඇත:

අ. බඳවා ගන්නා ලද හෙද/අතුරු වෛද්‍ය වෘත්තිකයින් පුහුණු පාඨමාලාවලට යොමු කිරිම පිණිස සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් ඇබෑර්තුන් අවශ්‍ය ප්‍රමාණයට නොලැබිම.

ආ. අවශ්‍යතාවයට සරිලන පරිදි ප්‍රමාණවත් ගිලන් රථ සංඛ්‍යාවක් නොමැතිවීම සහ පවතින ගිලන් රථ වලින් වැඩි ප්‍රමාණයක් පැරණි ඒවා බැවින් නිතර අළුත්වැඩියා කිරීමට සිදුවීම.

ඇ. ඖෂධ/සැරහුම් සහ අනෙකුත් වෛද්‍ය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

ඈ. යුද්ධ හමුදා රෝහලෙහි රාජකාරි කරනු ලබන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් භට නිවාස පහසුකම් නොමැතිවීම.

## විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලය

1. යුක්ති මූලධර්මයන්ට හා යුද්ධ හමුදා පනතෙහි ප්‍රකාරව යුද්ධාධිකරණයන් මෙහෙයවීම සම්බන්ධයෙන් විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලයේ කාර්‍යභාර්ය වේ. විනිසුරු අධිනීතිඥ ජෙනරාල්වරයා විසින් යුද්ධාධිකරණයන්හි මූලසුන දරමින් එකී නඩු කෘත්තයන්හිදී උද්ගත වන ඕනෑම නීතිමය කරුණක් හෝ ක්‍රියා මාර්ගයක් සම්බන්ධයෙන් නීතිමය උපදෙස් ලබාදෙනු ලබයි. එසේම යුද්ධාධිකරණයන්හිදී මෙහෙයවනු ලබන සාක්ෂි වාර්තාකරණය විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලයේ ප්‍රධානතම කාර්යයක් වන අතර එකී සාක්ෂි සටහන්හි නිරවද්‍යතාවය හා සුරක්ෂිත භාවය විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලය වගකීමට යටත් වේ.

2. යුද්ධ හමුදා ප්‍රධාන නීති උපදේශක හා විනිසුරු අධිනීතිඥ ජෙනරාල්වරයා ලෙස යුද්ධ හමුදාධිපති තුමා වෙත නීතිමය උපදෙස් ලබාදීම විනිසුරු අධිනීතිඥ ජෙනරාල්වරයා විසින් සිදු කරනු ලබන තවත් එක් වැදගත් කාර්යයක් වේ.


3. **විශ්ලේෂණය සහ ඇගයීම.** ඕනෑම අධිකරණයන්හි සාර්ථකත්වය රඳා පැවැත්මෙහිලා බලපාන ප්‍රධානතම කාරණාවන් දෙකකි. ඒවා නම් ලබාදෙනු ලබන නඩු තීන්දුවෙහි ගුණාත්මකභාවය සහ කිසිදු අතපහසුවීමක් නොමැති බැව් තහවුරු කරගැනීමයි. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදෙනු ලබන නව නඩු තීන්දු හා අනෙකුත් ප්‍රජාතන්ත්‍රවාදී රටවල්හි ශ්‍රේෂ්ඨාධිකරණ ලබා දෙන නඩු තීන්දු අධ්‍යනය කිරීම මගින් විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලය විසින් නිරතුරුවම තම නීතිමය දැනුම යාවත්කාලීන කරගැනීමෙහිලා කටයුතු කරනු ලබයි. 2015 වර්ෂයේ විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලයෙහි පැවති යුද්ධාධිකරණ නඩු විභාග 07 අතුරින් 2016 වර්ෂය සඳහා ඉදිරියට පැවැත්වීමට ශේෂව ඇත්තේ එක් නඩු විභාගයක් පමණි.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## යුද්ධ හමුදා පුහුණු ආඥා මූලස්ථානය

1. ආඥා මූලස්ථානය යුද්ධ හමුදා පුහුණුහි වගකීම් වනුයේ යුද්ධ හමුදා සිද්ධාන්ත සංවර්ධනය කිරීම, පුහුණු කිරීම හා පර්යේෂණ කිරීම් සම්බන්ධ යුධ උපාය මාර්ග නිර්මාණය කිරීම සහ යාවත්කාලීන අවශ්‍යතා අනුව යුද්ධ හමුදා පුහුණුවීම් වලට අදාල නිර්දේශ සැකසීම වේ.

රූප සටහන 22:1 යුද්ධ හමුදා පුහුණු ආඥා මූලස්ථානය යටතේ ඇති සංස්ථා.




2. 2015 වසරේ සිදුකරන ලද සාක්‍යතා වර්ධන ක්‍රියාකාරකම් ඉන්දියානු යුද්ධ හමුදා ප්‍රකාශණ සංවර්ධන කණ්ඩායමේ ප්‍රවීණයන්ගේ මාර්ගෝපදේශණය ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංකල්ප හා සිද්ධාන්ත එළිදැක්වීමට ලබාගන්නා ලදි.

3. යටිතල පහසුකම් සංවර්ධනය යටත් පුහුණු පාසල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවුරුදු සැලැස්ම නගා සිටුවීමට යුද්ධ හමුදාධිපතිගේ සහය ලබාගන්නා ලදි. මෙම ව්‍යාපෘති ප්‍රමුඛතාවය මත වර්ග කරන ලද අතර පුහුණු පාසල් 06 ක ඉදිකිරීම් කටයුතු දැනටමත් ආරම්භ කර ඇත යුද්ධ හමුදාධිපති වෙත මිලියන 72 ක මුදලක් මේ සඳහා ලැබී ඇත.

4. **ගැටළු හා අභියෝග**. පහත සඳහන් ගැටළු අභියෝග අනාගතයේදී ජය ගැනීමට ඇත:

අ. **<u>සංකල්ප හා සිද්ධාන්ත අදහස් ප්‍රකාශයට පත්කිරීම.</u>** දැනට සේවයේ නියුතු හා විශ්‍රාමගත ප්‍රවීණ නිළධාරීන්ගේ උපදෙස් ලබා ගෙන ප්‍රකාශයට පත්කිරීම.

ආ. ක්ෂේත්‍ර පුහුණු ප්‍රදේශ වර්ථමානයේදී බොහෝමයක් පුහුණු පාසල් මුහුණපාන ගැටළුවක් වන්නේ ක්ෂේත්‍ර ප්‍රගුණ භූමි නොමැතිකමය. යුද්ධ හමුදාව නම්කල ක්ෂේත්‍ර භූමි තිබුනද සිවිල් ජනවාශ ආශ්‍රිතවීම නිසා එම පුහුණු කටයුතු සිදුකරගෙනයාමේදී බාධා එල්ල වේ.

5. **<u>ලගාකරගත නොහැකි වූ ඉලක්කයන්.</u>** 2015 වසරේදි ලගාකරගත නොහැකි වූ ඉලක්කයන් පහත පරිදි වේ:

අ. සේවයේ නියුතු හා විශ්‍රාම ගත් ප්‍රවීණ නිළධාරින්ගෙන් උපදෙස් ලබාගැනිම.

ආ. ප්‍රතිත්‍රස්ත සංකල්ප හා සිද්ධාන්ත නිමකිරිම.

ඇ. ප්‍රතිත්‍රස්ත සංකල්ප හා සිද්ධාන්ත වලට අදාල ආධාරක සංකල්ප හා සිද්ධාන්ත සම්පුර්ණ කිරිම .

6. **<u>අනාගත සැළසුම්:</u>** 2016 වසරේදි සම්පුර්ණ කිරිමට ඇති දෑ ලෙස පහත සඳහන් කරුණු හදුනාගන්නා ලදි:

අ. දැනට තිබෙන සංකල්ප හා සිද්ධාන්ත ප්‍රවීණයන් මගින් පරීක්‍ෂණයන් කරවාගැනිම.

ආ. ප්‍රවීණයන්ගේ සහය ඇතිව ‘දෙවැනි පෙළ ප්‍රකාශනය’ නිර්මාණය කිරිම.

ඇ. ජ්‍යෙෂ්ඨ අණදෙන නිළධාරි පාඨමාලාව 2016 සිට ආරම්භ කිරිම.

ඈ. කනිෂ්ඨ අණදෙන නිළධාරි පාඨමාලාව හා කනිෂ්ඨ මාණ්ඩලික නිළධාරි පාඨමාලාව ඒකාබද්ධ කර එය කනිෂ්ඨ අණදෙන සහ මාණ්ඩලික නිළධාරි පාඨමාලාව ලෙස 2016 සිට ආරම්භ කිරිම.

ඉ. ප්‍රවර්ධන මාණ්ඩලික නිළධාරි පාඨමාලාව සාර්ථකව සම්පුර්ණ කරන ලද නිළධාරින් සඳහා සර් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්ව විද්‍යාලය මගින් ව්‍යාපර පරිපාලන ප්‍රවර්ධන කළමනාකරණ ආචාර උපාධිය පිරිනැම්ම.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## සංක්ෂිප්තය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ස්ථිර හා දෘෂ්‍යමානව යුද්ධ හමුදාවේ උන්නතිය හා රටේ ආරක්ෂක අවශ්‍යතා සපුරමින් සිටින බව අවසානයේ නිගමනය කල හැක. එය පුහුණුවෙන් හා ප්‍රතිසටන් කිරිම සඳහා සන්නද්ධ කිරීමෙන් මෙන්ම විරුද්ධවාදීන් පරාජය කිරිමට ජාතික ඉලක්කයන් සපුරාගනු වස් උපරිම සහය දීමටත් මනා ලෙස සංවිධානය වී ඇත.

මහජනයාගේ නොමද ප්‍රසාදය හා ප්‍රශංසාව නිරන්තරයෙන් යුද්ධ හමුදාව වෙත ලැබී ඇත. ප්‍රශ්චාත් යුධ සමයේදි ශ්‍රී ලංකාවට අභ්‍යන්තතර වශයෙන් හා බාහිර වශයෙන් විවිධ අභියෝගයන්ට මුහුණදීමට සිදුවුණි. මෙම පාරිසරික අභියෝගයන් පෙළගස්වා යුද්ධ හමුදාමය සාක්‍යතාව, ප්‍රහාරක හා ප්‍රවර්ධන සහ තොරතුරු හා සයිබර් මෙහෙයුම මෙන් ජාතික සංවර්ධන ව්‍යාපෘතිවල දායකත්වයට වැනි දේ සඳහා ආදේශ කොට ඇතග හඨ පිරිස් එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරි සඳහා මෙන්ම ජාතික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල යෙදවීම තුළින් සෘජුව හා වක්‍රව විදේශ ආදායම ලබාගැනිමට හැකියාව ලැබිම තුළින් ආරක්ෂක සංවර්ධනය වැඩි කරගැනිමට දායකත්වය ලබාදීමට හැකි වී ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යුද්ධ හමුදාවේ මූලික අංශයන් පුහුණු කිරීමෙන් හා සංවර්ධනය කර කාර්ය සාධනය සඳහා සුදුසු නායකයන් බිහිකිරිමට අවධානය යොමු කර ඇත. ආයතනයේ සාර්ථකත්වය කෙරෙහි බලපාන ප්‍රධාන කරුණක් වන්නේ අංශයන්හි ඉලක්ක සපුරාගැනිමයි. එම ඉලක්ක සපුරාගැනිම උදෙසා මානව සම්පත් සැලසුම් හා සංවර්ධනය කළමනාකරණය වැනි ප්‍රතිලාභ ලබා දී ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අදාල උපකරණ යොදාගනිමින් මෙහෙයුම් සඳහා වන ප්‍රතිඋත්තර දෙන යුධෝප්‍රාකමිකවල වඩා තීක්ෂණ හමුදාවක් ලෙස නිරන්තර ක්‍රියාකාරීත්වය තුළින් ඕනෑම ආක්‍රමණික අවස්ථාවකදි විස්තරණ ප්‍රතිචාර දැක්වීම තුළින් රටේ නිරන්තර සාමය ආරක්ෂා කරගැනීමට හැකිවනු ඇත.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## යුද්ධ හමුදා මුලස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරි තනතුරු නාම ලේඛණය - 2015

1. **ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති**
   අ. ලුතිතන් ජෙනරාල් ආර් එම් ඩි රත්නායක
   ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පි ආර්එස්පි විඑස්වී යුඑස්පි එන්ඩියු පිඑස්සි - 01.01.2015 -21.02.2015
   ආ. ලුතිතන් ජෙනරාල් ඒ ඩබ්ලිව් ජේ සි ද සිල්වා
   ආර්ඩබ්ලිව්පි විඑස්වී යුඑස්පි එන්ඩියු පිඑස්සි - 22.02.2015 -31.12.2015

2. **මාණ්ඩලික ප්‍රධානි**
   අ. මේජර් ජෙනරාල් එස් ඒ පි පි සමරසිංහ ආර්එස්පි
   විඑස්වී යුඑස්පි පිඑස්සි - 01.01.2015 -06.05.2015
   ආ. මේජර් ජෙනරාල් එන් ඒ ජේ සි ද ඩයස්
   ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පි ආර්එස්පි විඑස්වී යුඑස්පි එන්ඩිසි - 07.05.2015 -26.12.2015

3. **නියොජ්‍ය මාණ්ඩලික ප්‍රධානි**
   මේජර් ජෙනරාල් ඊ එම් එම් අඹන්පොල යුඑස්පි - 01.01.2015 -31.12.2015

## ප්‍රධාන මාණ්ඩලික නිළධාරින්

4. **යුධ සේවා ලේකම් ශාඛාව**
   අ. මේජර් ජෙනරාල් කේ ඒ ඩි ඒ කරුණාසේකර ආර්එස්පි
   විඑස්වී යුඑස්පි එන්ඩියු පිඑස්සි - 01.01.2015 -16.02.2015
   ආ. මේජර් ජෙනරාල් එන් යු එම් එම් ඩබ්ලිව් සේනානායක
   ආර්ඩබ්ලිව්පි ආර්එස්පි පිඑස්සි - 16.02.2015 -31.12.2015

5. **අධ්‍යක්ෂ ජෙනරල් ප්‍රධාන මාණ්ඩලික**
   අ. මේජර් ජෙනරාල් ඒ කේ එස් පෙරේරා
   ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පි ආර්එස්පි යුඑස්පි එන්ඩියු - 01.01.2015 -16.02.2015
   ආ. මේජර් ජෙනරාල් බි ඒ පෙරේරා ආර්එස්පි යුඑස්පි පිඑස්සි - 16.02.2015 -31.12.2015

6. **අධ්‍යක්ෂ ජෙනරල් මූල්‍ය කලමණාකරන**
   මේජර් ජෙනරාල් ආර් වි උඩවත්ත පිඑස්සි ඒටිඕ - 01.01.2015 -31.12.2015

7. **විධායක ජෙනරල්**
   මේජර් ජෙනරාල් එම් හතුරුසිංහ ආර්එස්පි එන්ඩිසි අයිපී - 01.01.2015 -31.12.2015

8. **උපකරණ මාස්ටර් ජෙනරල්**
   මේජර් ජෙනරාල් ආර් රත්නසිංහම් - 01.01.2015 -31.12.2015

9. **යුධෝකරණ මාස්ටර් ජෙනරල්**
   අ. මේජර් ජෙනරාල් එන් උඩවත්ත
   ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පි විඑස්වී යුඑස්පි එන්ඩිසි පිඑස්සි - 01.01.2015 -16.02.2015
   ආ. මේජර් ජෙනරාල් ජී ඩි එච් කේ ගුණරත්න
   ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පි ආර්එස්පි යුඑස්පි එන්ඩිසි පිඑස්සි - 16.02.2015 -31.12.2015

10. **අධ්‍යක්‍ෂ ජෙනරාල් පාබල**

අ. මේජර් ජෙනරාල් එල් ඩබ්ලිව් සි බි බි රාජගුරු
ආර්ඩබ්ලිව්පි ආර්එස්පි යූඑස්පි එල්ඩිඑම්සි - 01.01.2015 -13.03.2015
ආ. මේජර් ජෙනරාල් එස් ඩබ්ලිව් එල් දවුලගල
ආර්එස්පි විඑස්වි යූඑස්පි එන්ඩියූ - 13.03.2015 -31.12.2015

<u>ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති උපදේශක මඩුල්ල</u>

11. **ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු**

අ. මේජර් ජෙනරාල් එල් එන් වික්‍රමසූරිය
ආර්එස්පි විඑස්වි යූඑස්පි එන්ඩියූ පිඑස්සි - 01.01.2015 -01.09.2015
ආ. බ්‍රිගේඩියර් එස් ජේ එම් ඒ ආර් සෙනෙවිරත්න
ආර්ඩබ්ලිව්පි යූඑස්පි පිඑස්සි (වැඩබලන) - 01.09.2015 -31.12.2015

12. **ප්‍රධාන සංඥා නිළධාරි**

අ. මේජර් ජෙනරාල් කේ ආර් පි රොවෙල්
ආර්ඩබ්ලිව්පි යූඑස්පි එන්ඩියූ පිඑස්සි - 01.01.2015 -31.12.2015

13. **අධ්‍යක්‍ෂ ජෙනරාල් ක්‍රීඩා**

අ. මේජර් ජෙනරාල් ආර් එම් ජේ ඒ රත්නායක
ආර්එස්පි යූඑස්පි එල්ඩිඑම්සි - 01.01.2015 -25.08.2015
ආ. මේජර් ජෙනරාල් එස් ආර් මානවඩුගේ
ආර්ඩබ්ලිව්පි ආර්එස්පි එන්ඩියූ පිඑස්සි අයිජි - 09.09.2015 -31.12.2015

14. **යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ ජෙනරාල්**

මේජර් ජෙනරාල් එස් එච් මුණසිංහ
ආර්ඩබ්ලිව්පි ආර්එස්පි යූඑස්පි - 01.01.2015 -31.12.201

15. **විනිසුරු අධිනීතිඥ ජෙනරාල්**

අ. කර්නල් ඊ එස් ජයසිංහ යූඑස්පි (වැඩබලන) - 01.01.2015 -10.04.2015
ආ. බ්‍රිගේඩියර් ආර් පි රාජපතිරණ ආර්එස්පි යූඑස්පි පිඑස්සි - 10.04.2015 -31.12.2015

<u>අධ්‍යක්‍ෂ වරුන්</u>

16. **ක්‍රියාන්විත අධ්‍යක්‍ෂ**

අ. බ්‍රිගේඩියර් එච් එම් ජේ කේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වි
ආර්ඩබ්ලිව්පි ආර්එස්පි පිඑස්සි - 01.01.2015 -16.02.2015
ආ. බ්‍රිගේඩියර් ඩි සි කැප්පෙටිවලාන ආර්එස්පි පිඑස්සි - 16.02.2015 -26.02.2015
ඇ. බ්‍රිගේඩියර් එච් එම් ජේ කේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වි
ආර්ඩබ්ලිව්පි ආර්එස්පි පිඑස්සි - 26.02.2015 -28.12.2015
ඈ. බ්‍රිගේඩියර් එච් එච් ඒ එස් පි කේ සේනාරත්න
ආර්එස්පි පිඑස්සි - 28.12.2015 -31.12.2015

17. **පුහුණු අධ්‍යක්‍ෂ**

බ්‍රිගේඩියර් කේ පී ඒ ජයසේකර
ඩබ්ලිව්ඩබ්ලිව්වි ආර්එස්පි යූඑස්පි එන්ඩිසි පිඑස්සි - 01.01.2015 -31.12.2015

18. **සැලසුම් අධ්‍යක්‍ෂ**

අ. බ්‍රිගේඩියර් බි වි ඩි පි අබේනායක යූඑස්පි - 01.01.2015 -06.05.2015
ආ. බ්‍රිගේඩියර් එච් එම් ජේ කේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වි
ආර්ඩබ්ලිව්පි ආර්එස්පි පිඑස්සි (වැ:බ:) - 06.05.2015 -27.08.2015
ඇ. බ්‍රිගේඩියර් ඩබ්ලිව් ආර් පි ද සිල්වා යූඑස්පි එන්ඩියූ අයිජි - 27.08.2015 -31.12.2015

19. **බුද්ධි අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් ටි එස් සලේ ආර්ඩබ්ලිව්පි යුඑස්පි පිඑස්සි - 01.01.2015 -31.12.2015

20. **මනෝ විද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ**

අ. බ්‍රිගේඩියර් එච් ආර් කේ පි පීරිස් යුඑස්පි - 01.01.2015 -03.12.2015
ආ. බ්‍රිගේඩියර් ඩබ්ලිව් බි ඩි පි ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පි
ආර්එස්පි යුඑස්පි පිඑස්සි - 03.12.2015 -31.12.2015

21. **මාණ්ඩලික රාජකාරි අධ්‍යක්ෂ**

අ. බ්‍රිගේඩියර් ඒ එම් එස් බි අතපත්තු - 01.01.2015 -23.02.2015
ආ. බ්‍රිගේඩියර් එච් ඩබ්ලිව් එස් ඩි බි පතන්වල ආර්එස්පි එන්ඩියු - 23.02.2015 -31.12.2015

22. **ජනමාධ්‍ය අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් කේ ජේ ජයවීර ආර්ඩබ්ලිව්පි ආර්එස්පි යුඑස්පි - 01.01.2015 -31.12.2015

23. **ක්‍රීඩා අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් ජි ජේ ඒ ඩබ්ලිව් ගලගමගේ - 01.01.2015 -31.12.2015

24. **තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් කේ එම් ආර් පී කරුණාතිලක පිඑස්සි - 01.01.2015 -31.12.2015

25. **අයවැය හා මුල්‍ය කළමණාකරණ අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් ඩබ්ලිව් ආර් පලිහක්කාර යුඑස්පි - 01.01.2015 -31.12.2015

26. **අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් එම් එස් සී පෙරේරා යුඑස්පී - 01.01.2015 -31.12.2015

27. **වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් කේ ඒ ඩි එස් එල් පෙරේරා එල්එස්සි - 01.01.2015 -31.12.2015

28. **වත්කම් කලමණාකරණ අධ්‍යක්ෂ**

අ. බ්‍රිගේඩියර් එම් ඒ ඒ ඩි සිරිනාග - 01.01.2015 -31.08.2015
ආ. බ්‍රිගේඩියර් ආර් ෂන්මුහනාදන් එච්ඩිඑම්සි එල්එස්සි - 31.08.2015 -31.12.2015

29. **යහසාධක අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් ඒ වි රූපසිංහ - 01.01.2015 -31.12.2015

30. **කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ**

කර්නල් ඒ කේ ඒ බි ගුණරත්න (කාːනිː) - 01.01.2015 -31.12.2015

31. **පිරිස් පරිපාලන අධ්‍යක්ෂ**

අ. බ්‍රිගේඩියර් එන් ඒ ධර්මරත්න ආර්ඩබ්ලිව්පි ආර්එස්පි
එන්ඩියු පිඑස්සි - 01.01.2015 -03.09.2015
ආ. බ්‍රිගේඩියර් ඒ එල් එස් කේ පෙරේරා ආර්එස්පි
යුඑස්පි එන්ඩියු - 03.09.2015 -31.12.2015

32. **වෛද්‍ය සේවා අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් කේ පී සුමණපාල - 01.01.2015 - 31.12.2015

33. **දන්ත වෛද්‍ය සේවා**

බ්‍රිගේඩියර් ඊ ජී ජයකොඩි යුඑස්පි - 01.01.2015 - 31.12.2015

34. **වෛද්‍ය උපර්ජන අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් ටි ජේ ලියනාරච්චි - 2.09.2015 -31.12.2015

35. **කළමණාකරණ හා නඩත්තු අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් බි එස් විදානගේ - 01.01.2015 - 31.12.2015

36. **යුද්ධ හමුදා නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ**

කර්නල් එච් ටි වික්‍රමසේකර (කාඃනිඃ) - 20.01.2015- 31.12.2015

37. **නීතිසේවා අධ්‍යක්ෂ**

කර්නල් ඊ එස් ජයසිංහ යුඑස්පි (කාඃනිඃ) - 01.01.2015 -31.12.2015

38. **විනයාරක්ෂක අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් ඩි කේ ජි ඩි සිරිසේන යුඑස්පි - 01.01.2015 -31.12.2015

39. **සුභසාධක අධ්‍යක්ෂ**

අ. බ්‍රිගේඩියර් එස් කේ ජී එන් බි ඇහැලමල්පේ ආර්එස්පි - 01.01.2015 -09.03.2015
අ. බ්‍රිගේඩියර් ඩි ඒ ආර් රණවක ආර්එස්පි අයිජී - 09.03.2015 -04.08.2015
අ. බ්‍රිගේඩියර් ඩි සි එස් වන්නිආරච්චි එල්එස්සි - 04.08.2015 -31.12.2015

40. **රණවිරුසේවා අධ්‍යක්ෂ**

අ. බ්‍රිගේඩියර් බ්‍රිගේඩියර් එච් ඩබ්ලිව් එස් ඩි බි පනන්වල
ආර්එස්පි එන්ඩියු - 01.01.2015 -20.02.2015
ආ. බ්‍රිගේඩියර් සි එම් ඩි පි චන්ද්‍රසේකර - 20.02.2015 -25.03.2015
ඇ. බ්‍රිගේඩියර් ඩි ඒ ආර් රණවක ආර්එස්පි අයිජී (වැඃබඃ) - 25.03.2015 -09.04.2015
ඈ. බ්‍රිගේඩියර් එන් ඒ පි සි නාපාගොඩ යුඑස්පි අයිජී - 09.04.2015 -31.12.2015

41. **පුනරුත්ථාපන අධ්‍යක්ෂ ජෙනරල්**

මේජර් ජෙනරල් ඒ එස් ද ඉසෙඩ් වික්‍රමරත්න යුඑස්පි
එන්ඩීසි පිඑස්සි අයිජී - 01.01.2015 - 10.06.2015

42. **පුනරුත්ථාපන අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් එස් කේ තිරුණාවුකරසු යුඑස්පි - 10.06.2015 - 31.12.2015

43. **මානව හිමිකම් හා මානුෂවාදී නීති අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් ජේ ආර් අම්පෙමොහොට්ටි ආර්එස්පි - 01.01.2015 - 31.12.2015

44. **භට නිවාස සම්පාදන අධ්‍යක්ෂ**

අ. බ්‍රිගේඩියර් එම් මුදන්නායක ආර්එස්පි යුඑස්පි (වැඩබලන)- 01.01.2015 -01.02.2015
ආ. බ්‍රිගේඩියර් කේ එන් එස් කොටුවේගොඩ අයිජී - 01.02.2015 -31.12.2015

45. **ගමන් පාලන අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් එම් මුදන්නායක ආර්එස්පි යුඑස්පි - 01.01.2015 -31.12.2015

46. **ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් ආර් එම් පෙරෙමුනේ එල්එස්සි - 01.01.2015 -31.12.2015

47. **සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ ජෙනරල්**

මේජර් ජෙනරල් ඒ කේ පි වික්‍රමසිංහ යුඑස්පි - 01.01.2015 -31.12.2015

48. **යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ**

බ්‍රිගේඩියර් එච් පී අයි විද්‍යානන්ද යුඑස්පි ජ්ජ්ටීම් එල්එස්සි - 01.01.2015 -31.12.2015

49. **විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ ජෙනරල්**

අ. මේජර් ජෙනරල් ටි එන් ජයසූරිය යුඑස්පි එච්ඩීඑම්සි - 01.01.2015 - 18.04.2015
ආ. බ්‍රිගේඩියර් පි එස් ආර් එල් රාජකරුණා එල්එස්සි - 18.04.2015 - 31.12.2015

50. **ආධුනිකයින් බඳවා ගැනීමේ අධ්‍යක්ෂ**

අ. බ්‍රිගේඩියර් ටි ජේ නානායක්කාර ආර්ඩබ්ලිව්පි යුඑස්පි - 01.01.2015 - 07.09.2015
ආ. බ්‍රිගේඩියර් ඩි එම් ඩබ්ලිව් ඩබ්ලිව් ඩබ්ලිව් එම් ආර් බි එම්
දවුලගල ආර්එස්පි - 07.09.2015 - 31.12.201

51. **ස්වාධීන අධ්‍යක්ෂ**

අ. බ්‍රිගේඩියර් ඩබ්ලිව් පී එච් ඒ එස් බණ්ඩාර
ආර්ඩබ්ලිව්පි ආර්එස්පි - 01.01.2015 - 27.02.2015
ආ. බ්‍රිගේඩියර් ඒ එස් හේවාවිතාරණ ආර්එස්පි යුඑස්පි අයිජී - 27.02.2015 - 31.12.2015